# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්තමාන අමාත්‍ය මණ්ඩලය වෙත විෂයයන් හා කාර්යයන් පැවරීම

(විෂයයන් හා කාර්යයන් පැවරීමට අදාල අංක : 2289/43 හා 2022 ජූලි මස 22 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයට 2024 මැයි මස 03 දින දක්වා සිදුකරන ලද සංශෝධන ඇතුලත් කර සකසා ඇත)


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | ආරක්ෂක අමාත්‍ය | 2 |
| 2. | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය | 3 |
| 3. | තාක්ෂණ අමාත්‍ය | 6 |
| 4. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය | 7 |
| 5. | වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය | 9 |
| 6. | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය | 10 |
| 7. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය | 11 |
| 8. | ධීවර අමාත්‍ය | 14 |
| 9. | අධ්‍යාපන අමාත්‍ය | 15 |
| 10. | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය | 19 |
| 11. | ජනමාධ්‍ය අමාත්‍ය | 20 |
| 12. | සෞඛ්‍ය අමාත්‍ය | 22 |
| 13. | ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය | 24 |
| 14. | කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය | 25 |
| 15. | වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය | 30 |
| 16. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය | 31 |
| 17. | සංචාරක හා ඉඩම් අමාත්‍ය | 33 |
| 18. | ඉවත් කරන ලදී | - |
| 19. | කර්මාන්ත අමාත්‍ය | 34 |
| 20. | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය | 36 |
| 21. | විදේශ කටයුතු අමාත්‍ය | 38 |
| 22. | බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය | 40 |
| 23. | විදුලිබල හා බලශක්ති අමාත්‍ය | 41 |
| 24. | පරිසර අමාත්‍ය | 43 |
| 25. | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය | 44 |
| 26. | වාරිමාර්ග අමාත්‍ය | 45 |
| 27. | කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය | 46 |
| 28. | මහජන ආරක්ෂක අමාත්‍ය | 48 |
| 29. | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය | 49 |

උපලේඛනය

**01.** ආරක්ෂක අමාත්‍ය

| **I** වැනි තීරුව | **II** වැනි තීරුව | **III** වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම<br>5. අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම<br>6. රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන් පවත්වාගෙන යාම<br>7. ආගන්තුක හමුදාවන් හා සබඳතා පවත්වාගෙන යාම<br>8. ජාත්‍යන්තර මානුෂීය මෙහෙයුම් සඳහා සහයෝගය ලබාදීම<br>9. පුපුරණ ද්‍රව්‍ය හා ගිනිඅවි පිළිබඳ කටයුතු<br>10. ප්‍රදීපාගාර නඩත්තුවට අදාළ කටයුතු (වරාය අධිකාරිය සතු ප්‍රදීපාගාර හැර)<br>11. ආරක්ෂක සේවයේ පුද්ගලයන් සඳහා ආරක්ෂක අධ්‍යාපනය හා පශ්චාත් සේවා අධ්‍යාපනය ලබාදීම<br>12. ආරක්ෂක සේවා පිරිස් සඳහා උසස් අධ්‍යාපනය ලබාදීම<br>13. පුද්ගලික ආරක්ෂක සේවා සම්බන්ධ කටයුතු<br>14. ගලවාගැනීමේ මෙහෙයුම් සහ වෙරළ ආරක්ෂක සේවය පරිපාලනය කිරීම<br>15. උදර්පණයට අදාළ කටයුතු<br>16. වෘද්ධ රණවිරුවන් හා ආබාධිත | 1. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය<br>2. ශ්‍රී ලංකා යුද හමුදාව<br>3. ශ්‍රී ලංකා නාවික හමුදාව<br>4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>5. රාජ්‍ය බුද්ධි සේවාව<br>6. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br>7. ජාතික ශිෂ්‍යභට බලකාය<br>8. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය<br>9. සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය<br>10. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය<br>11. මිලෝදා ආයතනය කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පීඨයක් ලෙස<br>12. ආරක්ෂක සේවා විද්‍යාලය<br>13. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය<br>14. ජාතික ආරක්ෂක අධ්‍යයනය ආයතනය<br>15. ජාතික ආරක්ෂක විද්‍යායතනය<br>16. රක්නා ආරක්ෂණ ලංකා සමාගම<br>17. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව<br>18. ජාතික ආරක්ෂක අරමුදල<br>19. රණවිරු සේවා අධිකාරිය<br>20. අපි වෙනුවෙන් අපි අරමුදල<br>21. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව<br>22. ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව<br>23. ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය<br>24. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය<br>25. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | • ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත (2009 අංක 35)<br>• යුධ හමුදා පනත (1949 අංක 17)<br>• නාවික හමුදා පනත (1950 අංක 34)<br>• ගුවන් හමුදා පනත (1949 අංක 41)<br>• උදර්පණ නීතිය (1977 අංක 8)<br>• පුපුරණ ද්‍රව්‍ය පනත (1956 අංක 21)<br>• ගිනි අවි ආඥා පනත (1916 අංක 33)<br>• වෙඩිපිටි සහ යුධ හමුදා පුහුණුවීමේ පනත (1951 අංක 24)<br>• උපයෝගිතා හා පරිපූරක පනත (1985 අංක 40)<br>• පීඩාකාරී අවි පනත (1966 අංක 18)<br>• මුහුදු කොල්ලකෑම් පනත (2001 අංක 9)<br>• ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (1979 අංක 48)<br>• මහජන ආරක්ෂක ආඥා පනත (1947 අංක 25)<br>• රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත (2007 අංක 58)<br>• ශ්‍රීමත් ජොන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත (1981 අංක 68)<br>• ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනත (2008 අංක 5)<br>• ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීමේ පනත (1999 අංක 11)<br>• සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීමේ පනත (2000 අංක 42)<br>• පෞද්ගලික ආරක්ෂක නියෝජිතායතන පනත (1998 අංක 45)<br>• වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු පනත (2009 අංක 41)<br>• රණවිරු සේවා අධිකාරිය පනත (1999 අංක 54)<br>• අපි වෙනුවෙන් අපි අරමුදල පනත (2008 අංක 6) |

| | | |
|---|---|---|
| සොල්දාදුවන් පිළිබඳ කටයුතු<br>17. කාලගුණය හා දේශගුණය පිළිබඳ සේවාවන් සැපයීම<br>18. කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම<br>19. නායයෑම් ආපදා කළමනාකරණය සහ ඊට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම<br>20. ස්වභාවික ව්‍යසන පෙරයීම් කිරීම හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම<br>21. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම<br>22. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවල දී ගලවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම<br>23. ස්වාභාවික ව්‍යසන වලට ඔරොත්තු දෙන පරිදි (ප්‍රත්‍යස්ථ) ඉදිකිරීම් ප්‍රවර්ධනය සහ තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම<br>24. නිවාස හා ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම<br>25. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>26. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | • ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13)<br>• ජාතික ජලශාස්ත්‍රීය පනත (2024 අංක 7)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**02. මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා මුදල්, ආර්ථික ස්ථායීකරණ, බදුකරණය විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන | 1. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව<br>2. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව<br>3. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>4. රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව<br>5. මහා භාණ්ඩාගාරය<br>6. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>7. ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br>8. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව<br>9. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව<br>10. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | • විසර්ජන පනත්<br>• රේගු ආඥාපනත (1956 අංක 17)<br>• විදේශීය ණය පනත (1957 අංක 29)<br>• හර බදු පනත (2007 අංක 12)<br>• ඔට්ටු ඇල්ලීම් හා සූදු බදු පනත (1998 අංක 40)<br>• ආර්ථික සේවා ගාස්තු පනත (2006 අංක 13)<br>• රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය ආඥාපනත (1891 අංක 5)<br>• සුරාබදු ආඥාපනත (52 වැනි අධිකාරය)<br>• මූල්‍ය කල් බදු පනත (2000 අංක 56)<br>• මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ |

ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
4. ජාතික ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනය
5. ජාතික සංවර්ධන හා රාජ්‍ය ආයෝජන වැඩසටහන් පිළියෙල කිරීම
6. රාජ්‍ය මූල්‍ය හා මහා පරිමාණ මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය
7. ආර්ථික අර්බුදයට හේතු හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්ෂණික පුනර්ජීවන පිලියම් සහ වැඩසටහන් හඳුන්වා දීම
8. රටතුල ස්ථායි හා තිරසර ආර්ථික වර්ධනයක් ඇතිකරලීම සඳහා අවශ්‍ය වන ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන් හඳුන්වා දීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම
9. ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් තිරස්ව ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය අධීක්ෂණය කිරීම
10. ද්විපාර්ශවික සහ බහු පාර්ශවික වෙළඳ ගිවිසුම් සහ එම ගිවිසුම් තුළින් පැනනගින ආරවුල් නිරාකරණය කිරීම ඇතුළු ජාත්‍යන්තර සහ කලාපීය වෙළඳ ඒකාබද්ධතාවයන් පහසුකරලීමේ සහ සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම
11. වාර්ෂික අයවැය පිළියෙල කිරීම සහ මූල්‍ය සම්පත් කළමනාකරණය
12. ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සහ අයවැයමය සහ මූල්‍යමය පාලනය බලාත්මක කිරීම
13. ජාතික බදු ප්‍රතිපත්ති කළමනාකරණය සහ රජයේ ආදායම් ඵලදායී ලෙස පරිහරණය කිරීම
14. ආර්ථික සංවර්ධනය උදෙසා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැඩකටයුතු සම්බන්ධීකරණය
15. ජාත්‍යන්තර නියෝජිතායතන සමග සම්බන්ධීකරණය සහ ආර්ථික සංවර්ධනය සඳහා විදේශ සම්පත් යෙදවීම
16. ආධාර දෙන සංවිධාන සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග කටයුතු සමායෝජනය කිරීම
17. රජයේ මුදල් රෙගුලාසි බලාත්මක කිරීම
18. ඒකාබද්ධ අරමුදල් කළමනාකරණය

11. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
12. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
13. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
14. නීති කටයුතු දෙපාර්තමේන්තුව
15. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
16. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
17. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
18. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
19. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
20. ශ්‍රී ලංකා රේගුව
21. සුරාබදු දෙපාර්තමේන්තුව
22. ජාතික ලොතරැයි මණ්ඩලය
23. සංවර්ධන ලොතරැයි මණ්ඩලය
24. තක්සේරු දෙපාර්තමේන්තුව
25. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
26. **ඉවත් කරන ලදී.**
27. ශ්‍රී ලංකා මහ බැංකුව
28. සියලුම රාජ්‍ය බැංකු, මූල්‍ය ආයතන, රක්ෂණ සමාගම් හා ඒවායේ පාලිත සමාගම් හා ආශ්‍රිත ආයතන
29. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
30. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්
31. ණය තොරතුරු කාර්යංශය
32. **ඉවත් කරන ලදී.**
33. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
34. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය
35. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
36. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
37. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
38. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
39. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
40. බදු අභියාචනා කොමිෂන් සභාව
41. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
42. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
43. තිරසර සංවර්ධන සභාව
44. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

පනත (2006 අංක 6)
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (2003 අංක 3)
- රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (2000 අංක 43)
- ලෝහෝර් ආර්යා අරමුදල පනත (1951 අංක 38)
- දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (1923 අංක 8)
- ජාතිය ගොඩනැගීමේ බදු පනත (2009 අංක 9)
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (2006 අංක 5)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත (1995 අංක 15)
- ආනයන හා අපනයන (පාලන) පනත (1969 අංක 1)
- මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2006 අංක 12)
- මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත (2008 අංක 10)
- මුද්දර ගාස්තු පනත (1982 අංක 43)
- එකතු කළ අගයමත බදු පනත (2002 අංක 14)
- සුභසාධක ප්‍රතිලාභ පනත (2002 අංක 24)
- මුදල් පනත (1971 අංක 38)
- පරිසර සංරක්ෂණ බදු පනත (2008 අංක 26)
- බදු අභියාචනා කොමිෂන් සභාව පනත (2008 අංක 23)
- ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත (2002 අංක 35)
- ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනත (1988 අංක 53)
- තිරසර සංවර්ධන පනත (2017 අංක 19)
- සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)
- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත (1978 අංක 15)
- දේශීය ආදායම් පනත (2017 අංක 24)
- මුදල් නීති පනත (1949 අංක 58)
- ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත (1971 අංක 30)
- මහජන බැංකු පනත (1961 අංක 29)
- ලංකා බැංකු ආඥා පනත (1938 අංක 53)
- බැංකු පනත (1988 අංක 30)
- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

19. ආදායම් නියෝජිතායතනයන්හි සමස්ත අධීක්ෂණය
20. රාජ්‍ය බැංකු හා මූල්‍ය නියෝජිතායතන මෙහෙයවීම හා අදාල මාර්ගෝපදේශ ලබා දීම
21. රාජ්‍ය වියදම් කළමනාකරණය
22. රජයේ මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ හා රෙගුලාසි සකස් කිරීම හා ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම
23. සියලු රාජ්‍ය ආයතන සතු වාහන, ගොඩනැගිලි, ඉඩම් ආදී රාජ්‍ය දේපළ පිළිබඳව තොරතුරු පවත්වාගෙන යාම හා එම සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රමවේදයන් සකස් කිරීම
24. දෙපාර්තමේන්තුමය හා වෙනත් පොදු අරමුදල් අධීක්ෂණය
25. රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාව පිළිබඳ භාණ්ඩාගාර සටහන් පවත්වාගෙන යාම
26. සේවක සංඛ්‍යා කළමනාකරණය හා වැටුප් නියම කිරීම පිලිබඳ උපදේශක සේවා
27. ශ්‍රී ලංකා මහ බැංකුව සමග සම්බන්ධීකරණයෙන් මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සාර්ව ආර්ථික කළමනාකරණය
28. ආදායම් එකතු කිරීම හා වියදම් පිළිබඳ පසු විපරම් කිරීම
29. දෙපාර්තමේන්තුවල කළමනාකරණ විගණන ප්‍රවර්ධනය කිරීම සඳහා වන මාර්ගෝපදේශ සම්පාදනය
30. රක්ෂණ කටයුතු විධිමත් කිරීම
31. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජයට අයත් සමාගම්වල මූල්‍ය පරිපාලනය
32. **ඉවත් කරන ලදී.**
33. ඈවර කිරීමට හෝ වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ කිරීමට නියමිත II තීරුවේ දැක්වෙන අයිතම අංක 52 සිට 59 දක්වා වන ආයතන වල කටයුතු අවසන් කිරීම
34. කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපාර මොඩලයක් බවට පත්කර සංචාරක මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම
35. ඉංජිනේරු උපදේශන සේවා හා ඉදිකිරීම් කටයුතු
36. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
37. II තීරුවෙහි දැක්වෙන සියලුම

45. රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර සංගමය
46. වර්ජන, කෝලාහල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල
47. ජාතික රක්ෂණ භාර අරමුදල
48. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල
49. ලෝහෝර් ආර්යා අරමුදල
50. **ඉවත් කරන ලදී.**
51. **ඉවත් කරන ලදී.**
52. විදුලි සංදේශ දෙපාර්තමේන්තුව
53. වනජීවී භාරය
54. ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය
55. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව
56. මාංශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය
57. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්
58. දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල
59. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ආයතන
60. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන
61. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
62. නෝර්ත් සී ලිමිටඩ්
63. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
64. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
65. ජාතික ලුණු සමාගම
66. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
67. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්
68. සීමාසහිත බී.සී.සී.සමාගම
69. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
70. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි-සිනමා උද්‍යානය
71. සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩිං සමාගම
72. සහස්‍යා ඉන්වෙස්මන්ට් ලිමිටඩ්
73. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

පනත (1997 අංක 7)
- බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනත (1990 අංක 4)
- ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (1987 අංක 36)
- ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත (2008 අංක 41)
- ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (2006 අංක 28)
- සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශෙෂ විධිවිධාන) පනත (1993 අංක 19)
- සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)
- නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (1989 අංක 13)
- ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (1937 අංක 07)
- ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත (2005 අංක 28)
- මුදල් ව්‍යාපාර පනත (2011 අංක 42)
- විදේශ විනිමය පනත (2017 අංක 12)
- සංගණන ආඥා පනත (143 අධිකාරිය)
- රක්ෂණ සංස්ථා පනත (1961 අංක 02)
- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත (1990 අංක 18)
- ක්ෂුද්‍ර මූල්‍ය පනත (2016 අංක 06)
- මූල්‍ය සමාගම් පනත (1988 අංක 78)
- විනිමය පාලන පනත (1953 අංක 24)
- ශ්‍රී ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත (1975 අංක 13)
- කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත (2010 අංක 17)
- ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත (2006 අංක 30)
- ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත (2019 අංක 12)
- වරලත් ගණකාධිකාරී ආයතනය පනත (1959 අංක 23)
- ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (2008 අංක 14)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

| | | |
|---|---|---|
| ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

03. තාක්ෂණ අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා තාක්ෂණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.<br>5. අන්තර් රාජ්‍ය ආයතන සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම තුළින් රජයේ සේවා සැපයීමේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණ මූලාරම්භන සඳහා පහසුකම් සැපයීම හා අධීක්ෂණය.<br>6. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.<br>7. සමාජයේ සියළුම ස්ථරවල තොරතුරු තාක්ෂණය භාවිතය ධෛර්යමත් කිරීම හා ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය සහ පුද්ගලික අංශය සමඟ හවුල්වී තොරතුරු තාක්ෂණ මූලාරම්භයන් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.<br>8. සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැලැක්වීම.<br>9. ඩිජිටල් චෝහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහාය ලබාදීම.<br>10. ප්‍රමිතීන් පැනවීම සහ පරිපාලනය සම්බන්ධ කටයුතු<br>11. වර්ධනය වන තරඟකාරී වෙළඳපොළ තුළ, පොදු යහපත සුරකිමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය | 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ඊට අනුබද්ධිත ආයතන<br>2. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය<br>3. ඉවත් කරන ලදී<br>4. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ අනුබද්ධිත ආයතන<br>6. රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය<br>7. ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003අංක 27)<br>• ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6)<br>• ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)<br>• පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (2022 අංක 9)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ කටයුතු නියාමනය කිරීම<br>12. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු<br>13. හරිත තාක්ෂණ ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වලට තාක්ෂණික සහාය ලබාදීම.<br>14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>15. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**04. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම<br>5. රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම<br>6. ගැටුම් වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>7. කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>8. ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වලක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම | 1. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව<br>2. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br>3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>4. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>5. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය<br>6. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br>7. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය<br>8. ජාතික සමාජ සංවර්ධන ආයතනය<br>9. ග්‍රාම සංවර්ධන, පුහුණු හා පර්යේෂණ ආයතනය<br>10. සමාජ ආරක්ෂණ මණ්ඩලය<br>11. අබාධ තැනැත්තන් සඳහා වන ජාතික සභාව<br>12. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය<br>13. සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>14. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | • ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත (2005 අංක 34)<br>• ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත (1998 අංක 50)<br>• ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත (1941 අංක 24)<br>• ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)<br>• දිවි නැගුම පනත (2013 අංක 1)<br>• ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත (1992 අංක 41)<br>• සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත (1996 අංක 17)<br>• ආබාධ සහිත තැනැත්තන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (1996 අංක 28)<br>• දිළිඳු සහන පනත (1985 අංක 32)<br>• නිවර්තන නිවාස ආඥා පනත (1907 අංක 05)<br>• දරිද්‍රතා නීති ආඥා පනත (1939 අංක 30)<br>• අයාල ආඥා පනත (1841 අංක 4)<br>• වැඩිහිටි තැනැත්තන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (2000 අංක 9)<br>• දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය භාර අරමුදල පනත (1992 අංක 9)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් |

| | | |
|---|---|---|
| 9. කාන්තා මූලික ගෘහ ඒකක සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම<br>10. කාන්තා හා ළමා කටයුතු වලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම<br>11. ඉවත් කරන ලදී<br>12. ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම<br>13. අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම<br>14. ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම<br>15. ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම<br>16. සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම<br>17. සුවිශේෂී කුසලතා ඇති දරුවන් ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම<br>18. සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම<br>19. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකර දීම<br>20. මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම<br>21. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා සහ තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබාදීම<br>22. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම<br>23. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු<br>24. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>25. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>26. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම | | සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| 27. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම<br>28. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>29. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**05.** **වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වරාය, නාවික හා ගුවන් සේවා විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. වාණිජ වරායන් සංවර්ධනය, කළමනාකරණය හා ඒවායේ ආයෝජන අවස්ථා පුළුල් කිරීම<br>5. බහාලුම් අංගන සංවර්ධනය කිරීම<br>6. අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධන සහ පරිපාලන කටයුතු<br>7. නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය<br>8. නාවික සේවාවන් සඳහා තරහ රීති මාලාවන් පැනවීම<br>9. නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහාය වීම<br>10. බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාරගැනීම<br>11. නැව් ගාස්තු හා නාවික සේවා | 1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. සීමාසහිත ලංකා නැව් සංස්ථාව<br>3. වෙළඳ නාවික ලේකම් කාර්යාලය<br>4. සිවිල් ගුවන්සේවා අධිකාරිය<br>5. සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම<br>6. සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සහ එහි පාලිත සමාගම් | • ලංකා නැව් සංස්ථා පනත (1971 අංක 11)<br>• නැව් නියෝජිතයින්ට බලපත්‍රදීමේ පනත (1972 අංක 10)<br>• මාස්ටර්ස් ඇටෙන්ඩන්ට් ආඥාපනත (1865 අංක 6)<br>• වෙළඳ නැව් පනත (1971 අංක 52)<br>• ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත (1979 අංක 51)<br>• පහයන තටාක හා ජේටන්ට් දියත් ආඥාපනත (1908 අංක 5)<br>• බෝට්ටු ආඥාපනත (1900 අංක 4)<br>• ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත (2002 අංක 34)<br>• සිවිල් ගුවන් සේවා පනත (2010 අංක 14)<br>• ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත (1982 අංක 02)<br>• ගුවන් ප්‍රවාහන පනත (2018 අංක 29)<br>• ගගන යාත්‍රාංගන පනත (1950 අංක 15)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| කටයුතු<br>12. වෙරළාසන්න මගී ප්‍රවාහනය<br>13. නෞකා හිමිකාරීත්වය සහ මෙහෙයුම්, නැව් කළමනාකරණය, නැව් තැරැව්කරණය සහ නියෝජිත සේවා<br>14. රේගු නියෝජිතායතන සහ සමස්ථ නෞකා භාණ්ඩ ප්‍රවාහන විසඳුම්<br>15. ජාත්‍යන්තර හා දේශීය ගුවන් තොටුපලවල් සංවර්ධනය සහ නියාමන කටයුතු සිදුකිරීම<br>16. ගුවන්තොටුපල මගින් සැලසෙන සේවාවන්වල ගාස්තු සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම<br>17. ජාත්‍යන්තර ගුවන් ගමන් පුළුල් කිරීම සඳහා අනෙකුත් රටවල් සමග ගිවිසුම්වලට එළඹීම ඇතුලුව අනෙකුත් අවශ්‍ය පියවර ගැනීම<br>18. ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපලවල් විදේශ රටවල් විසින් භාවිතා කිරීමට අදාළ ප්‍රවර්ධනය හා නියාමනය<br>19. ගුවන් බඩු අපනයනය පුළුල් කිරීම<br>20. දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම<br>21. පුද්ගලික ගුවන් ගමන් සේවා නියාමනය<br>22. ගුවන්යානා ලියාපදිංචි කිරීම<br>23. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>24. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**06.** ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ආයෝජන ප්‍රවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි | 1. ටෙක්නෝ පාක් ඩිවලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්<br>2. තොරතුරු තාක්ෂණ උද්‍යාන<br>3. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය<br>4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>5. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව<br>6. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම<br>7. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම<br>8. කන්තලේ සීනි සමාගම<br>9. උක් පර්යේෂණ ආයතනය | • ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත (1979 අංක 40)<br>• මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (1978 අංක 4) (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නීතිය)<br>• කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11)<br>• උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| ප්‍රතිසංස්කරණය කිරිම<br>4. ශ්‍රී ලංකාව කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය<br>5. ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය ඍජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම<br>6. ආර්ථික සංවර්ධන කළාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය<br>7. තාක්ෂණ උද්‍යාන ඇති කිරීම.<br>8. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු<br>9. ජාතික යහපත සහ ආර්ථික දියුණුව අරමුණු කරගෙන විශේෂිත යටිතල සහ අනෙකුත් පහසුකම් සහිත ජාත්‍යන්තර ව්‍යාපාර හා සේවා කේන්ද්‍රස්ථානයක් වශයෙන් කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සංවර්ධනය කිරීම<br>10. උක් වගාව සඳහා අවශ්‍ය ජලය අරපිරිමැස්මෙන් භාවිතය සඳහා තාක්ෂණය මුසු වූ වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>12. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**07.** **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම | 1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br>2. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය<br>3. ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්<br>4. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව<br>5. රාජ්‍ය භාෂා කොමිසම<br>6. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව<br>7. ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය<br>8. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල<br>9. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල<br>10. පළාත් පාලන වැන්දඹු හා | • වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත (1983 අංක 24)<br>• වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනත (1898 අංක 1)<br>• වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1998 අංක 60)<br>• වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1970 අංක 18)<br>• රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත (1999 |

| | | |
|---|---|---|
| සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. රාජ්‍ය සේවයට අදාලව පවත්නා නීති රීති හා රෙගුලාසි සමාලෝචනයට ලක්කර සරල කිරීම<br>5. රාජ්‍ය සේවයේ ආරවුල් විසඳීම සඳහා බේරුම්කරණ ක්‍රියාවලියක් හඳුන්වා දීම<br>6. පහත සඳහන් සේවාවන්හි පරිපාලනය හා පිරිස් කළමනාකරණය<br>ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය<br>ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය<br>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය<br>ශ්‍රී ලංකා තාක්ෂණ සේවය<br>7. ඒකාබද්ධ සේවා පරිපාලනය කිරීම<br>8. ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන්<br>9. රාජ්‍ය සේවා පුහුණුව<br>10. විශ්‍රාම වැටුප් සංග්‍රහය ක්‍රියාත්මක කිරීම<br>11. පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතුවලට අදාළව රජය විසින් ඉටු කළයුතු කාර්යයන්<br>12. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගේ කාර්ය මණ්ඩලවලට සම්බන්ධ ආයතනික කටයුතු<br>13. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු<br>14. රාජ්‍ය උත්සව සංවිධානය කිරීම<br>15. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටු කරනු ලබන ජනතා කේන්ද්‍රීය සේවාවන් ශක්තිමත් කිරීම<br>16. උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු<br>17. පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම<br>18. පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම<br>19. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල අඩු පහසුකම් සහිත ක්ෂේත්‍ර / අංශ හඳුනාගෙන අදාල පහසුකම් ලබාදීම සඳහා විශේෂ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම<br>20. පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම<br>21. පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්<br>22. පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබාදීම<br>23. පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම<br>24. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම | අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල<br>11. පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල<br>12. සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br>13. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br>14. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය<br>15. දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>16. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව | අංක 40)<br>• රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල ආඥාපනත (1942 අංක 18)<br>• විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය<br>• පාසල් ගුරුවරුන් ගේ විශ්‍රාම වැටුප් පනත (1953 අංක 44)<br>• පළාත් සභා විශ්‍රාම වැටුප් පනත (1993 අංක 17)<br>• පළාත් පාලන සේවා පනත (1974 අංක 16)<br>• රජයේ හා අධිකරණ සේවා නිලධාරීන් ගේ විශ්‍රාම ගැන්වීමේ ආඥා පනත (1910 අංක 11)<br>• යුධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය<br>• ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය<br>• නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය<br>• අනිවාර්ය රාජ්‍ය සේවා පනත (1961 අංක 70)<br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත (1982 අංක 9)<br>• රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීම) පනත (1969 අංක 7)<br>• තෑගි පිරිනැමීමේ තරහ පනත (1957 අංක 37)<br>• රාජ්‍ය භාෂා පනත (1956 අංක 33)<br>• රාජ්‍ය භාෂා කොමිසම පනත (1991 අංක 18))<br>• ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත (1997 අංක 18)<br>• ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත (2007 අංක 26)<br>• බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත (1992 අංක 58)<br>• නිවාඩු පනත (1971 අංක 29)<br>• ප්‍රධාන මුලාදෑනීතැන තනතුර වෙනස් කිරීමේ පනත (1941 අංක 11)<br>• ගම්මුලාදෑනී තනතුර වෙනස් කිරීමේ පනත (1964 අංක 6)<br>• ග්‍රාම සේවක පදවි නාම |

| | | |
|---|---|---|
| විෂයයන්ට අදාළ කටයුතු<br>25. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | සංශෝධනය කිරීමේ පනත (1977 අංක 5)<br>• ග්‍රාම සේවා නිලධාරී පදවි නාම වෙනස් කිරීමේ පනත (1993 අංක 2)<br>• උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත (1951 අංක 17)<br>• උඩරට විවාහ හා දික්කසාද පනත (1952 අංක 44)<br>• මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (1951 අංක 13)<br>• නොතාරිස් ආඥාපනත (1907 අංක 1)<br>• ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1927 අංක 23)<br>• සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1907 අංක 19)<br>• භාර ආඥා පනත (1917 අංක 09)<br>• ඉඩම් (සන්තකය පැවරීමේ සීමා කිරීමේ) පනත (2014 අංක 38)<br>• මුද්දර පනත (2006 අංක 12)<br>• දඩ මුදල් වැඩි කිරීමේ පනත (2005 අංක 12)<br>• අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත (2017 අංක 05)<br>• ඇටර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ ආඥාපනත 1902 අංක 4)<br>• ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත (1941 අංක 24)<br>• මරණ ලියාපදිංචි කිරීමේ තාවකාලික පනත (2016 අංක 16)<br>• මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත (2010 අංක 19)<br>• පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරය)<br>• පළාත් සභා ඡන්ද විමසීම් පනත (1988 අංක 2)<br>• පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනත (1999 අංක 31)<br>• මහනගර සභා ආඥා පනත (52 අධිකාරිය)<br>• ප්‍රාදේශීය සභා පනත (1987 |

| | | |
|---|---|---|
| | | අංක 15)<br>• නගර සභා ආඥාපනත (255 අධිකාරිය)<br>• පළාත් සභා පනත (1987 අංක 42)<br>• පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත (1988 අංක 37)<br>• දේශිය ණය සහ සංවර්ධන අරමුදල ආඥාපනත (1916 අංක 22)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**08.** ධීවර අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ධීවර විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ධීවර අංශයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම තුලින් මත්ස්‍ය වගාවන් පුළුල් කිරීම<br>5. ජීව සහ අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම<br>6. නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් සාගර සම්පත් ආශ්‍රිත ආර්ථික සංවර්ධනය සඳහා අදාල ව්‍යාපෘති පුළුල් කිරීමට පහසුකම් සැපයීම<br>7. රජයට අයත් ධීවර යාත්‍රා කළමනාකරණය සහ මෙහෙයවීම<br>8. පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට සාධාරණයක් වන පරිදි මත්ස්‍ය නිෂ්පාදන අලෙවි කටයුතු පුළුල් කිරීම<br>9. අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් | 1. ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව<br>2. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය<br>3. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය<br>4. ලංකා ධීවර සංස්ථාව<br>5. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව<br>6. සී/ස. සීනෝර් පදනම | • ධීවර හා ජලජ සම්පත් පනත (1996 අංක 2)<br>• ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත (1990 අංක 23)<br>• ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය පනත (1981 අංක 54)<br>• ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත (1998 අංක 53)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම් වලට අවස්ථාව ලබාදීම<br>10. ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශයේ අනවසරයෙන් මසුන් ඇල්ලීම නතර කිරීම<br>11. දේශීය ටින් මාළු කර්මාන්තය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම<br>12. ධීවර කර්මාන්තය ආශ්‍රිතව ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිමත් කිරීම<br>13. අපනයන වෙළඳපොල ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය<br>14. ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම හා එලදායි බැංකු හා රක්ෂණ ක්‍රම හඳුන්වාදීම<br>15. සාගර විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වී ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>16. සමුද්‍ර, කිවුල් දිය(කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය<br>17. බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම<br>18. ධීවර වරායවල් සහ නැංගුරම් පොලවල් පිහිටුවීම, නඩත්තුව සහ කළමනාකරණය<br>19. ධීවර කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ යටිතල පහසුකම් දියුණු කිරීම හා ප්‍රමිතියෙන් යුතුව නඩත්තු කටයුතු<br>20. මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම හා බෙදාහැරීම<br>21. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>22. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**09. අධ්‍යාපන අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අධ්‍යාපන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. විභාග දෙපාර්තමේන්තුව<br>2. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව<br>3. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය<br>4. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ<br>5. ගුරු විද්‍යාල<br>6. ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම | • ප්‍රසිද්ධ විභාග පනත (1968 අංක 25)<br>• උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත - 1960 අංක 05<br>• උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත (1961 අංක |

| | | |
|---|---|---|
| 2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවයක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>5. ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ශ්‍රී ලාංකික ළමා හා යෞවන පරපුරට ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම<br>6. පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක්ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම<br>7. සෑම දරුවකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහතික කිරීම<br>8. විෂය බාහිර ක්‍රියාකාරකම් පාසැල් තුල ප්‍රචලිත කිරීම<br>9. ජාතික පාසැල් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම<br>10. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසැල් නියාමනය කිරීම<br>11. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම<br>12. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම<br>13. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>14. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම<br>15. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ අනෙකුත් අධ්‍යාපන සේවාවන් වල පිරිස් කළමනාකරණ කටයුතු<br>16. පාසල් සංවර්ධන මණ්ඩල පරිපාලනය<br>17. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය<br>18. පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් | 7. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය<br>8. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව<br>9. අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල<br>10. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව<br>11. ජාතික අධ්‍යාපන ආයතනය<br>12. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය<br>13. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා අනුබද්ධ ආයතන<br>14. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය<br>15. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)<br>16. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය<br>17. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීම් අධිකාරිය<br>18. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය<br>19. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව<br>20. ජාතික මූලික අධ්‍යයන ආයතනය<br>21. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම<br>22. ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය<br>23. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව<br>24. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව<br>25. ජාතික විද්‍යා පදනම<br>26. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය<br>27. නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය<br>28. ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය<br>29. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල<br>30. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් පිළිබඳ අරමුදල<br>31. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව<br>32. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br>33. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br>34. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>35. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ | 08)<br>• උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත (1981 අංක 65)<br>• ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩල පනත (1988 අංක 51)<br>• පාසල් සංවර්ධන මණ්ඩල පනත (1993 අංක 8)<br>• යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනත (1999 අංක 44)<br>• රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24)<br>• අධ්‍යාපන ආඥා පනත (1939 අංක 31)<br>• අධ්‍යාපන විද්‍යායතන පනත (1986 අංක 30)<br>• උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල පනත (1960 අංක 5)<br>• ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත (1991 අංක 19)<br>• ජාතික අධ්‍යාපන ආයතන පනත (1985 අංක 28)<br>• පිරිවෙන් අධ්‍යාපන පනත (1979 අංක 64)<br>• වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)<br>• ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)<br>• ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)<br>• ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)<br>• ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත (2017 අංක 15)<br>• ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතන පනත (2019 අංක 22)<br>• විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)<br>• ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත (2016 අංක 11)<br>• ශ්‍රී ලංකා නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත (1979 අංක 53)<br>• ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත (1998 අංක 59)<br>• රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත (1957අංක 49)<br>• තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)<br>• ශ්‍රී ලංකාවේ මූලික අධ්‍යයන |

| | | |
|---|---|---|
| ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම<br>19. සියලු පාසැල් වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පංති කාමර, ගුරුවරුන් ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියලු භෞතික පහසුකම් දියුණු කිරීම<br>20. ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණික පහසුකම් යොදාගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය<br>21. වෘත්තිය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>22. අධ්‍යාපන සුදුසුකම් නොසළකා වෘත්තීය අධ්‍යාපනය ලබාගැනීමට අවස්ථා ඇති කිරීම<br>23. දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම<br>24. විෂයමාලා නවීකරණයක් කොට, “One TVET” සංකල්පය යටතේ අදාල ආයතන ජාලගත කර, තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම<br>25. පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම<br>26. ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනිම<br>27. දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම<br>28. වෘත්තිය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුලත් කරමින් විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම<br>29. ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මඟින් වෘත්තීය පුහුනු අවස්ථා පුළුල් කිරීම<br>30. දේශීය හා විදේශිය රැකියා වෙළඳපල ඉලක්ක කර ගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>31. රැකියා අවස්ථාවන්ට ගැලපෙන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන ලෙස නගර විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට කටයුතු කිරීම<br>32. ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම | ඇති සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන<br>36. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය<br>37. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය<br>38. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | ආයතන පනත (1981 අංක 55)<br>• විශ්වවිද්‍යාල පනත (1978 අංක 16)<br>• බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)<br>• ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74)<br>• ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995අංක 29)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම<br>33. නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිපල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම<br>34. ජාතික නවෝත්පාදන ආයතනය පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>35. විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>36. නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම<br>37. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිපාලනයට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල  කළමනාකරණය සහ සංවර්ධනය කිරීම<br>38. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධවීම  හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම<br>39. උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ගයන් පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්ණායක හඳුනාගැනීම හා  ක්‍රියාත්මක කිරීම<br>40. දේශීය හා විදේශීය රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් උපාධිධාරින් බිහි කිරීම සඳහා සමස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂයමාලා සංශෝධනය කිරීම<br>41. විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරිම<br>42. සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල ඇති කිරිම සඳහා පියවර ගැනීම<br>43. සියළුම රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයකට පත්කිරිම සඳහා පියවර ගැනීම<br>44. ශ්‍රී ලංකාවේ සුදුසුකම් සහිත සිසුන්ට ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශ වීමට හැකිවන ලෙස ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>45. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය සහ ප්‍රතීතනය  කිරීම<br>46. බෞද්ධ හා පාලි අධ්‍යාපනය ඉහළ නැංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම<br>47. ගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයම අවරණය වන ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම<br>48. අධ්‍යාපන ප්‍රතිසංස්කරණය | | |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් වන ජනාධිපති කාර්ය සාධක බලකාය හා විශේෂ කමිටු වල නිර්දේශ මහජන කතිකාවතකට යොමු කොට අධ්‍යාපනයේ උන්නතිය සඳහා සුදුසු පරිදි ඒවා ක්‍රියාත්මක කිරිමට වැඩ පිළිවෙලක් සකස් කිරීම<br>49. තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම<br>50. ඵලදායී ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම හා ගුරුවරුන් පුහුණු කිරීමේ හා ඔවුන් ගේ කුසලතා සංවර්ධනය<br>51. පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම<br>52. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>53. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**10.** **ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ප්‍රවාහන හා මහාමාර්ග විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ග්‍රාමීය, පූර්ව නගර හා නාගරික ප්‍රදේශ සබඳතා පුලුල් කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්ත්වයෙන් යුත් ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ථ තත්ත්වයෙන් පවත්වාගෙන යාම<br>5. අධිවේගී මාර්ග සංවර්ධනය, නඩත්තුව, ගාස්තු නියම කිරීම, රැස්කිරීම සහ නියාමනය කිරීම | 1. මාර්ග සංවර්ධන අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. **ඉවත් කරන ලදී.**<br>3. මග නැඟුම<br>4. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව<br>5. ජාතික ගමනාගමන කොමිෂන් සභාව<br>6. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව<br>7. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව<br>8. සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පෞද්) සමාගම<br>9. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය<br>10. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය<br>11. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | • ජාතික මංමාවත් පනත (2008 අංක 40)<br>• මාර්ග සංවර්ධන අධිකාරිය පනත (1981 අංක 73)<br>• ජාතික මංමාවත් පනත (2008 අංක 40)<br>• ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත (1991 අංක 37)<br>• දුම්රිය පනත (1950 අංක 18)<br>• ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත (2005 අංක 27)<br>• ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත (1997 අංක 25)<br>• මෝටර් රථ ප්‍රවාහන පනත (1951 අංක 14)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| 6. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, එම වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මෙහෙයවීම<br>7. වාහන තදබදය අවම කිරීම සඳහා වාහන අංගන පිහිටුවීම<br>8. ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය හා නවීකරණය කිරීම<br>9. ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා ඉහළ මට්ටමේ ප්‍රවේශයක් සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සකස් කිරීම<br>10. මාර්ග ජාලය හා බැඳුණු පාලම් පද්ධතිය නවීකරණය කිරීම<br>11. මගී තොටුපල සේවාවන් සැපයීම<br>12. ආරක්ෂාකාරී සහ විශ්වාසනීය මගී ප්‍රවාහන සේවාවක් සැපයීම<br>13. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් හඳුන්වාදීම<br>14. පෞද්ගලික ප්‍රවාහන සේවාවන් නියාමනය කිරීම<br>15. බස් රථ නිෂ්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාල දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීම<br>16. නව දුම්රිය මාර්ග ඉදිකිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කිරීම, පුළුල් කිරීම සහ ඊට අදාළව ඉඩම් පවරා ගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුලු සියලු කටයුතු<br>17. වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම<br>18. මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම<br>19. රියදුරු බලපත්‍ර නිකුත් කිරීම<br>20. මෝටර් රථවාහනවලට අදාළ නීතිරීති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ නියාමනය කිරීම<br>21. හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයේ දායකත්වය උදෙසා උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>22. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>23. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**11.** ජනමාධ්‍ය අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |

| | | |
|---|---|---|
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජනමාධ්‍ය විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ගයන් ගැනීම<br>5. රජයේ මුද්‍රණ හා ප්‍රකාශන කටයුතු<br>6. ජනතාවගේ දැනුම ආකල්ප හා රසඥතාවය දියුණු කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික දියුණුව සඳහා ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම<br>7. මාධ්‍ය භාවිතය සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම වර්ධනය කිරීම<br>8. ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වාදීම<br>9. රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>10. ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම<br>11. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම<br>12. ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම<br>13. වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු<br>14. නවතම තාක්ෂණය සහ කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුලින් ව්‍යාපාර අරමුණු කර ගත් නවීන තැපැල් සේවයක් ලබාදීම සහ දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම<br>15. ලංකා මුද්දර කාර්යාංශය පරිපාලනය කිරීම<br>16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>17. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | 1. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව<br>2. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව<br>3. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව<br>4. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය<br>5. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව<br>6. ස්වාධීන රූපවාහිනී ජාලය<br>7. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව<br>8. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>9. සීමාසහිත ලංකා පුවත් ආයතනය<br>10. සැලසිනෙ මීඩියා සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී<br>11. ශ්‍රී ලංකා පදනම<br>12. තැපැල් දෙපාර්තමේන්තුව<br>13. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය<br>14. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය<br>15. ජාතික චිත්‍රපටි සංස්ථාව | • තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12)<br>• ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත (1973 අංක 5)<br>• ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37)<br>• ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8)<br>• ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත(1986 අංක 6)<br>• ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)<br>• ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5)<br>• ශ්‍රී ලංකා පදනම් පනත ( 1973 අංක 31)<br>• මුද්දර ආඥාපනත (1909 අංක 22)<br>• තැපැල් කාර්යාල ආඥාපනත (1908 අංක 11)<br>• ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18)<br>• රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**12.** සෞඛ්‍ය අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා සෞඛ්‍ය විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. මහජන සෞඛ්‍ය සේවාවන් ඉහළ ප්‍රමිතියකින් හා ජනහිතකාමී ලෙස පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>5. මහජනතාවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම<br>6. වසංගත, බෝවන රෝග සහ බෝ නොවන රෝග පැතිරීම පාලනය, වැළැක්වීම සහ නිවාරණයට අවශ්‍ය පියවර ගැනීම<br>7. ජාත්‍යන්තර නිරෝධායන සහ සනීපාරක්ෂණයට අදාළ නීතිරීති ක්‍රියාත්මක කිරීම<br>8. සියළුම රෝහල් සඳහා අත්‍යාවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම<br>9. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පර්යේෂණ අවස්ථා පුළුල් කිරීම සඳහා නව උපායමාර්ග හඳුන්වාදීම<br>10. සෞඛ්‍ය සේවයට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාධනය සඳහා ක්‍රියා කිරීම<br>11. පුද්ගලික රෝහල්, වෛද්‍ය සේවාවන් හා පරීක්ෂනාගාර කටයුතු ජාතික ප්‍රතිපත්තියක් තුළ නියාමනය කිරීම සහ විධිමත් සේවාවක් ලබා දිම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම<br>12. සෑම දිස්ත්‍රික්කයකම එක් රෝහලක් ජාතික රෝහල මට්ටමටම වැඩි දියුණු කිරීම හා දිස්ත්‍රික් තුළ ඇති අනෙකුත් ප්‍රාදේශීය හා ප්‍රාථමික රෝහල් පහසුකම් පුළුල් කිරීම | 1. ජාතික සෞඛ්‍ය සභාව<br>2. වෛද්‍ය පර්යේෂණ ආයතනය<br>3. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය<br>4. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව<br>5. ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාල සභාව<br>6. පෞද්ගලික වෛද්‍ය නියාමන සභාව<br>7. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>8. සියලුම ජාතික, ශික්ෂණ හා නිශ්චිත රජයේ රෝහල්<br>9. වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පාසල<br>10. ජාතික වෘක්කවේද, කාන්දු පෙරීම හා බද්ධ කිරීමේ ආයතනය<br>11. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල<br>12. විජය කුමාරතුංග අනුස්මරණ රෝහල<br>13. අෂ්රොෆ් අනුස්මරණ රෝහල<br>14. දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය<br>15. 1990 සුවසැරිය පදනම<br>16. ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල<br>17. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව<br>18. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව<br>19. ජාතික ඖෂධ නියාමන අධිකාරිය<br>20. ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>21. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව<br>22. ආයුර්වේද වෛද්‍ය සභාව<br>23. ආයුර්වේද විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය<br>24. ආයුර්වේද ශික්ෂණ හා පර්යේෂණ රෝහල්<br>25. හෝමියෝපති රෝහල වැලිසර<br>26. හෝමියෝපති වෛද්‍ය සභාව<br>27. වකුගඩු අරමුදල | • සෞඛ්‍ය සේවා පනත (1952 අංක 12)<br>• වෛද්‍ය ආඥාපනත (1927 අංක 26)<br>• වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත (1912 අංක 9)<br>• මනෝ රෝග ආඥාපනත (1870 අංක 1)<br>• ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල පනත (1981 අංක 13)<br>• සාත්තු නිවාස (නියාමනය) කිරීමේ පනත (1949 අංක 16)<br>• විෂ වර්ග, අබිං සහ අන්තරායක ඖෂධ වර්ග ආඥාපනත (1929 අංක 17)<br>• පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත (2006 අංක 21)<br>• ශ්‍රී ලංකා හෙද සභා පනත (1988 අංක 19)<br>• මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත (1987 අංක 48)<br>• ආහාර පනත (1980 අංක 26)<br>• ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩල පනත (1983 අංක 54)<br>• විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් මණ්ඩල පනත (1999 අංක 38)<br>• දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත (2006 අංක 27)<br>• 1990 සුවසැරිය පදනම පනත (2018 අංක 18)<br>• ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත (2015 අංක 5)<br>• ආයුර්වේද පනත (1961අංක 31)<br>• හෝමියෝපති පනත (1970 අංක 7)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| 13. ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ සහ අනෙකුත් අදාල සෞඛ්‍ය සෞඛ්‍ය සේවාවන් පරිපාලනය හා පිරිස් කළමනාකරණය | | |
| 14. වෛද්‍ය සහ පරිපූරක වෛද්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය සහ කුසලතා ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පුහුණු අවස්ථා පුළුල් කිරීම සම්බන්ධ කටයුතු | | |
| 15. පාසල් සෞඛ්‍ය කටයුතු සහ දරුවන් ගේ දන්ත වෛද්‍ය සේවා ක්‍රියාත්මක කිරීම | | |
| 16. පොදු සනීපාරක්ෂාව සහ දුම්රිය සේවා සනීපාරක්ෂාව | | |
| 17. වතු අංශයේ සෞඛ්‍ය කටයුතු | | |
| 18. ජාතික රුධිර පාරවිලයන සේවා සම්බන්ධ කටයුතු | | |
| 19. ත්‍රිපෝෂ හා විශේෂයෙන් කිරි දෙන මව්වරුන් සඳහා පෝෂණ ගුණයෙන් යුතු ආහාර සැපයීම බෙදාහැරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 20. 1990 සුවසැරිය ගිලන් රථ සේවාව කාර්යක්ෂමව පවත්වාගෙන යාම | | |
| 21. ඖෂධ වර්ග නිෂ්පාදනය ආනයනය සහ බෙදාහැරීම ඉහළ ප්‍රමිතියකින් හා කාර්යක්ෂමව සිදු කිරීම | | |
| 22. ප්‍රමිතියෙන් යුත් ඖෂධ නිෂ්පාදනය, ආනයනය | | |
| 23. වෙළඳපල ඒකාධිකාරය වැලැක්වීම හා පාරිභෝගිකයා ආරක්ෂා වන පරිදි ඖෂධ මිල ගණන් පාලනය කිරීම | | |
| 24. ඖෂධ ආනයනය විනිවිධභාවයකින් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුල සිදුවන බවට වග බලා ගැනීම | | |
| 25. පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම | | |
| 26. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රම සංවර්ධනය හා නියාමනය කිරීම ක්‍රියාත්මක කිරීම | | |
| 27. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය | | |
| 28. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමවලට අවශ්‍ය අමු හා නිෂ්පාදිත ඖෂධ ආනයනය, විකිණීම හා බෙදාහැරීම | | |
| 29. ආයුර්වේද, සිද්ධ, යුනානි ආදි දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අදාළ රෝහල්, පර්යේෂණ හා පුහුණු ආයතන සහ ඖෂධ වෙළඳසැල් පිහිටුවීම හා කළමනාකරණය | | |
| 30. ඖෂධ පැලැටි හා සකස්කළ ආයුර්වේද, සිද්ධ හා යුනානි ඖෂධ අපනයනය නියාමනය කිරීම | | |
| 31. ආයුර්වේද ඖෂධ නිෂ්පාදකයන් නියාමනය කිරීම | | |
| 32. ඖෂධ පැලැටි වගාව ප්‍රවර්ධනය කිරීම හා දේශීය ඖෂධ වර්ග වැඩි දියුණු කිරීම ආශ්‍රිත ව්‍යාපෘති අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් ඉටු කිරීම | | |

| | | |
|---|---|---|
| 33. ආයුර්වේද නිෂ්පාදකයන්, ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් හා ආයුර්වේද අතුරු වෛද්‍ය සේවක පිරිස් ලියාපදිංචි කිරීම<br>34. ආයුර්වේද රෝහල්, ආයුර්වේද පර්යේෂණ ආයතන, පුහුණු ආයතන සහ ඔසුසල් පිහිටුවීම, මෙහෙයවීම සහ ප්‍රවර්ධනය<br>35. සංචාරකයින් සඳහා ප්‍රතිකාර කිරීමට දේශීය පාරම්පරික හා ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් සංචාරක මණ්ඩලයේ සම්බන්ධීකරණය හා නියාමනය තුළ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>36. දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම දිරි ගැන්වීම<br>37. දේශීය වෛද්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණ කටයුතු<br>38. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>39. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

## 13. ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම<br>5. ජලසම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සොයාබලා ඒ පිළිබඳව නව සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම හා | 1. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2. ජල සම්පත් මණ්ඩලය<br>3. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව<br>4. වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය<br>5. වැවිලි මානව සංවර්ධන භාරය<br>6. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම<br>7. වතු අංශයේ ස්වයං රැකියා වක්‍රීය අරමුදල | • ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත (1974 අංක 2)<br>• ජල සම්පත් මණ්ඩල පනත (1964 අංක 29)<br>• වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය පනත (2018 අංක 32)<br>• සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම පනත (2005 අංක 19)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| නඩත්තුව<br>6. ග්‍රාමීය වැව් ජලාශ සහ වාරිමාර්ග පද්ධතීන් සම්බන්ධීකරණය කරමින් ජල සුරක්ෂිතතාව සහ නාගරික ජල යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම<br>7. පානීය ජලය බෙදාහැරීමේදී සිදුවන ජලය අපතේ යාම වලක්වා ගැනීම<br>8. ප්‍රජා ජල සම්පාදන හා ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරිම සඳහා පියවර ගැනීම<br>9. ග්‍රාමීය ජනතාවට ප්‍රමිතියෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම<br>10. ග්‍රාමීය පළාත්වල පානීය ජල සැපයුම ස්ථාවර කර ගැනීම ජලාශ, ජල පෝෂිත මාර්ග සංවර්ධනය හා ජල සංරක්ෂණ කටයුතු<br>11. ජාතික වාරිමාර්ග පද්ධතිය මගින් ග්‍රාමීය හා  ප්‍රා දේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ජලසම්පාදන ව්‍යාපෘති ආශ්‍රිතව ජලය බෙදාහැරීමේ ව්‍යාපෘති කඩිනම් කිරීම<br>12. රජයේ සහ පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් නව ගම්මාන සහ නගර නිර්මාණය කිරීම<br>13. වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් සවිබලගැන්වීම සඳහා මූලික පහසුකම්, ජීවනෝපාය උත්පාදන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුලු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම<br>14. ග්‍රාමීය වතු අංශයන්හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම<br>15. වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන “ජන මුල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන” පිහිටුවීම<br>16. වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරිම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරිම<br>17. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>18. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**14.** කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |

| | | |
|---|---|---|
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කෘෂිකර්ම සහ වැවිලි විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනය<br>5. තොග පවත්වා ගැනීම් හා සැපයුම් කටයුතු ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම<br>6. භෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>7. දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම<br>8. සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම<br>9. තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරි ගැන්වීම<br>10. රසායනික පලිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව යෙදීම නියාමනය කිරීම<br>11. කෘෂිකාර්මික කටයුතු වල යෙදෙන්නන් සඳහා වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම<br>12. සෘජු නිෂ්පාදකයින්, සැකසුම් ආයතන, තොග වෙළඳ සමාගම සහ අපනයන සමාගම් අතර සැපයුම් සබඳතා ශක්තිමත් කිරීම මගින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබාදීම<br>13. දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු, ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මගින් ස්වභාවික ආපදාවන් අවම කර ගැනීම<br>14. ප්‍රමිතියෙන් යුතු බීජ හා පැලෑටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම<br>15. ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම | 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>3. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය<br>4. වී අලෙවි මණ්ඩලය<br>5. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය<br>6. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව<br>7. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය<br>8. ජාතික පොහොර ලේකම් කාර්යාලය<br>9. සීමාසහිත ලංකා පොහොර සමාගම<br>10. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම<br>11. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)<br>12. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය<br>13. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>14. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්<br>15. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්<br>16. සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිස් සමාගම<br>17. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන<br>18. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය<br>19. ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>20. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>21. තේ පර්යේෂණ ආයතනය<br>22. තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය<br>23. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව<br>24. රබර් පර්යේෂණ ආයතනය<br>25. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව<br>26. තේ ශක්ති අරමුදල<br>27. තුරුසවිය අරමුදල<br>28. අපනයන කෘෂිකර්ම | • කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20)<br>• ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)<br>• ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)<br>• ගස් හෙළීම (පාලන කිරීම) පනත (1951 අංක 9)<br>• බීජ වී පනත (2003 අංක 22)<br>• පස් සංරක්ෂණ පනත (1996 අංක 24)<br>• වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)<br>• ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)<br>• කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)<br>• රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1972 අංක 11)<br>• පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)<br>• පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)<br>• පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)<br>• ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 18)<br>• සත්ත්ව රෝග පනත (1992 අංක 59)<br>• සත්ත්ව ආහාර පනත (1986 අංක 15)<br>• සත්ත්ව පනත (1958 අංක 29)<br>• පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)<br>• ජාතික වැවිලි කළමනාකරණ ආයතනය පනත (1979 අංක 45)<br>• තේ, රබර් සහ පොල්වතු (කැබලි කිරීම පාලන) පනත (1958 අංක 2)<br>• ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය (1975 අංක 14)<br>• තේ පාලන පනත (1957 අංක 51)<br>• තේ සහනාධාර පනත (1958 අංක 12)<br>• තේ (බදු හා අපනයන පාලනය) පනත (1959 අංක 16)<br>• තේ පර්යේෂණ මණ්ඩල පනත (1993 අංක 52)<br>• තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)<br>• කුඩා තේ වතු සංවර්ධන පනත |

| | | |
|---|---|---|
| කළමනාකරණය කිරීම<br>16. කෘෂිකාර්මික සංවර්ධන කලාප, කෘෂි ගම්මාන හා තිරසර ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් ප්‍රචලිත කිරීම<br>17. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නගාසිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>18. කාබනික පොහොර භාවිතය සහ වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැටසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම<br>19. ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදාහැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම<br>20. නියමිත ප්‍රමිතියෙන් යුත් රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම<br>21. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම<br>22. දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයේ සාධාරණ මිළ ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>23. ගෙවතු වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>24. අතිරික්ත නිෂ්පාදනය ගබඩා කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කිරීම<br>25. කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම<br>26. ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම<br>27. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම<br>28. රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය<br>29. දේශීය නිෂ්පාදනය වැඩිකිරීම තුලින් ආහාර භෝග ආනයනය අවම කිරීම<br>30. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම<br>31. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු<br>32. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>33. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ | දෙපාර්තමේන්තුව<br>29. ශ්‍රී ලංකා කජු සංස්ථාව<br>30. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය<br>31. පොල් වගා කිරීමේ මණ්ඩලය<br>32. පොල් සංවර්ධන අධිකාරිය<br>33. පොල් පර්යේෂණ ආයතනය<br>34. තල් සංවර්ධන මණ්ඩලය<br>35. කිතුල් සංවර්ධන මණ්ඩලය<br>36. කප්රුක අරමුදල<br>37. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව | (1975 අංක 35)<br>• රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත (1953 අංක 36)<br>• රබර් පර්යේෂණ මණ්ඩල ආඥාපනත (1930 අංක 10)<br>• රබර් පාලන පනත (1956 අංක 11)<br>• තුරුසවිය අරමුදල් පනත (2000 අංක 23)<br>• අපනයන කෘෂි සංවර්ධන පනත (1992 අංක 46)<br>• පොල් සංවර්ධන පනත (1971 අංක 46)<br>• පොල් පර්යේෂණ මණ්ඩල පනත (1950 අංක 37)<br>• කප්රුක අරමුදල් පනත (2005 අංක 31)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු<br>34. විවිධ භූගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළ සංවර්ධනය දිරි ගැන්වීම<br>35. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම<br>36. මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපලවල් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම<br>37. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පාරිභෝජන අවස්ථා පුළුල් කිරීම<br>38. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය<br>39. දේශීය ගොවි නිෂ්පාදන සඳහා වෙළඳපල පුළුල් කිරීම<br>40. සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රටතුල වගා කිරීම සඳහා කටයුතු කිරීම<br>41. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය<br>42. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරඟකාරිත්වය ඉහළ නැංවීම<br>43. ජාත්‍යන්තර වෙළඳපල ඉලක්ක කරගත් වැවිලි බෝග මත පදනම් වූ අගය එකතු කල නිෂ්පාදන සම්බන්ධ කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>44. තේ, රබර් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු<br>45. තේ, රබර් හා පොල් වතු කැබලි කර ජනාවාස ඉදිකිරීම උපරිම වශයෙන් සීමා කිරීම<br>46. වැවිලි භෝග කර්මාන්ත සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම වැඩි කිරීම<br>47. කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන් දිරිගැන්වීම තුලින් රබර් නිෂ්පාදන කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සුලභ කිරීම<br>48. තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම<br>49. ග්‍රාමීය තේ වගාව ප්‍රවර්ධනය හා කුඩා තේ වතු හිමියන් දිරිගැන්වීම<br>50. තේ අපනයනය සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම<br>51. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකා තේ (Ceylon Tea) සඳහා ජාත්‍යන්තර තේ වෙළඳපොල පුළුල් කිරීම<br>52. රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම්ද ඇතුලත්ව ආශ්‍රිත භෝග | | |

| | | |
|---|---|---|
| වගා කටයුතු වර්ධනය කිරීම<br>53. දේශීය හා විදේශීය වෙළඳපොල ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම<br>54. වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරිම<br>55. තේ, රබර් හා පොල් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම<br>56. කුඩා වැවිලි භෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>57. පර්යේෂණ ආයතනයන් හා ඒකාබද්ධව වැඩි අස්වනු සහිත ප්‍රභේද ගොවියන් වෙත හඳුන්වා දීමට ක්‍රියා කිරීම<br>58. නවීන තාක්ෂණයද භාවිතා කරමින් දේශීය නිෂ්පාදන වල අගය එකතු කිරීම තුලින්, ඉහල වටිනාකමකින් යුත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම, අපනයන වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම<br>59. සුළු වැවිලි භෝග කර්මාන්ත සුරක්ෂිතභාවය ඇති කරමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරීම සඳහා පියවර ගැනීම<br>60. කුඩා වැවිලි බෝග වගා කටයුතු සඳහා ගුණාත්මක භාවයෙන් යුත් බීජ හා පැල ලබාදීම මගින් ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම<br>61. අගය එකතු කල නිෂ්පාදනය ද ඇතුලුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම<br>62. කුරුඳු, ගම්මිරිස්, වැනි දේශීය බෝග වර්ග ප්‍රති අපනයනය වෙනුවට ශ්‍රී ලංකා සන්නාමය සහිතව අපනයන වෙළඳපළ සඳහා දියුණු කිරීම<br>63. කුඩා වැවිලි භෝග සඳහා අපනයන ගම්මාන පිහිටුවීම<br>64. පොල්, කිතුල් හා තල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ ඊට අදාල පර්යේෂණයන්ට අදාළ කටයුතු<br>65. දේශීය පොල් ඉල්ලුම සපුරාලීමටත් පොල්, තැඹිලි, කුරුම්බා ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහාත් ක්‍රමෝපායන් සැකසිම<br>66. බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම<br>67. භූගෝලීය සාධකද සැලකිල්ලට ගෙන අධි ඵලදාවක් සහිත පොල් පැල ප්‍රභේද හඳුන්වා දීම | | |

| | | |
|---|---|---|
| 68. දේශීය හා විදේශීය වෙළඳපල ඉලක්ක කරගනිමින්, නව තාක්ෂණයද මුසු වූ අගය එකතු කල පොල්, කිතුල් හා තල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම<br>69. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>70. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**15. වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. වනාන්තර, වනසතුන් හා තුරුලතා ආරක්ෂා කිරීම හා සංරක්ෂණය<br>5. වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>6. ග්‍රාමීය ප්‍රදේශ වල නිවාස, දේපල හා වගාවන් සඳහා වන සතුන්ගෙන් වන හානි අවම කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම<br>7. අලි මිනිස් ගැටුම් වැලැක්වෙන පරිදි ගම් හා ජනාවාස ආරක්ෂාව සඳහා ග්‍රාමීය ප්‍රජා දායකත්වයෙන් යුතුව ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම<br>8. සිව්පාවුන්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශි කිරීම සහ ප්‍රදර්ශනය කිරීමට අදාළ කටයුතු<br>9. කැලෑ සහ වන විද්‍යා කටයුතු<br>10. වන සණත්වය සුරක්ෂිත කිරීම හා හරිත ආවරණය පුළුල් කිරීම<br>11. රටේ වන ඝනත්වය සුරක්ෂිත කරමින් දැව අවශ්‍යතාවය සපුරා ගැනීමට | 1. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>3. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව<br>4. රාජ්‍ය දැව සංස්ථාව | • වනසංරක්ෂණ ආඥාපනත (1907 අංක 16)<br>• ජාතික උරුම වනභූමි පනත (1988 අංක 3)<br>• වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනත (1937 අංක 2)<br>• ජාතික සත්වෝද්‍යාන පනත (1982 අංක 41)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| වාණිජ වන වගා ප්‍රවර්ධනය කිරීම<br>12. වගුරු බිම් හා කඩොලාන පද්ධති සංරක්ෂණය කිරීම<br>13. හරිත සහ සුහුරු නගර සංකල්පය ප්‍රචලිත කිරීම තුලින් පරිසර සංවේදී ජනතාවක් බිහි කිරීම<br>14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>15. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**16. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. සමාජ අවශ්‍යතාවන් සහ ගෝලීය ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනු ලබන ප්‍රතිසංස්කරණ සිදුකිරීම<br>5. නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම<br>6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වෙනත් කිසිවෙකු වෙත පවරාදෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු<br>7. උසාවි පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම ඇතුලුව සමස්ත පරිපාලනයට අදාළ සියලු කටයුතු ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටුකිරීම හා ඒ සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම<br>8. රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු<br>9. රජයට සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම<br>10. නීති කෙටුම්පත් කිරීම | 1. නීතිපති දෙපාර්තමේන්තුව<br>2. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br>3. ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුව<br>4. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව<br>5. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය<br>6. ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව<br>7. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය<br>8. ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම<br>9. සමථ මණ්ඩල කොමිෂන් සභාව<br>10. නීති අධ්‍යාපන සභාව<br>11. ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය<br>12. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් ආර්බිට්‍රේෂන් සෙන්ටර් (ගරන්ටි) ලිමිටඩ්<br>13. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය<br>14. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය<br>15. හානිපූරණය සඳහා වන කාර්යාලය<br>16. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය<br>17. බන්ධනාගාර දෙපාර්තමේන්තුව<br>18. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව<br>19. තරුණ වරදකරුවන් ගේ විශෝධන පුහුණු පාසැල<br>20. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය | • උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩලය පනත (1987 අංක 50)<br>• ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත (2001 අංක 10)<br>• නීති අධ්‍යාපන මණ්ඩල සභා පනත (1974 අංක 6)<br>• ණය සහනදායක ආඥාපනත (1941 අංක 39)<br>• විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත (1956 අංක 15)<br>• ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනත (1988 අංක 69)<br>• පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත (1990 අංක 19)<br>• සමායතන නීතිඥ ආයතන නීතිය (1978 අංක 33)<br>• අධිකරණ සංවිධාන පනත (1978 අංක 2)<br>• උසාවි භාෂා පනත (1961 අංක 3)<br>• ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන් ගේ ආයතනය පනත (1985 අංක 46)<br>• නීති කොමිෂන් සභා පනත (1969 අංක 3)<br>• නීති ආධාර පනත (1978 අංක 11)<br>• සමථ මණ්ඩල පනත (1988 අංක 72)<br>• වංචා වැළැක්වීමේ ආඥාපනත (1840 අංක 7)<br>• සමාජ අබලතා වැළැක්වීමේ පනත (1957 අංක 21)<br>• ප්‍රාථමික අධිකරණ සංවිධාන පනත (1979 අංක 44)<br>• රාජ්‍ය (සිවිල් වරදෙහිලා වගකීම්) පනත (1969 අංක 22) |

| | | |
|---|---|---|
| 11. යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාව දීම, අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම<br>12. සමස්ත ක්වාසි පද්ධතියේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>13. කම්කරු විනිශ්චය සභා පරිපාලනය සහ ඊට අදාළ අනෙකුත් කටයුතු=<br>14. සිවිල් ආරවුල්, අධිකරණය දක්වා නොගොස් විසඳා ගැනීම සඳහා සමථ මණ්ඩල ක්‍රියාවලිය බල ගැන්වීම<br>15. නීතිය ක්‍රියාත්මක කිරීමේ පටිපාටි සහ යාන්ත්‍රණය පිලිබඳ අදාල පුද්ගලයන්ට අවශ්‍ය නවීන දැනුම හා තාක්ෂණික පුහුණුව ලබා දීම<br>16. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම<br>17. අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම හා අතුරුදහන් වූවන් හා ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම<br>18. ගැටුම් හා අර්බුද හේතුවෙන් හා හානියට පත්වූ පුද්ගලයින් සඳහා හානිපූර්ණයට අදාල කටයුතු<br>19. රට තුළ ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානයත් කල් පවත්නා සාමයත් ප්‍රවර්ධනය කරලීම හා ඒ සඳහා ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම<br>20. ජාතීන් අතර සහයෝගීතාව සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය සංවාද වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම<br>21. ජනතා පරමාධිපත්‍ය හා ජාතික ආරක්ෂාව තහවුරු වන බවට සහතික වෙමින් කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පියවර ගැනීම<br>22. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට අදාල කටයුතු සිදුකිරීම<br>23. බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැළසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>24. බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය<br>25. බන්ධනාගාර වල යටිතල පහසුකම් සංවර්ධනය හා තදබදය අඩු කිරීම<br>26. බන්ධනාගාර ගතවූවන් පුනරුත්ථාපනය කිරීම<br>27. ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු<br>28. අර්බුද හේතුවෙන් ශාරීරික හා මානසික ආබාධවලට ලක් වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | • අපරාධ වැළැක්වීමේ ආඥාපනත (1926 අංක 2)<br>• ක්වාසි අධිකරණ (පත්වීම් වලංගු කිරීමේ) පනත<br>• අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (2015 අංක 4)<br>• ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත (2000 අංක 44)<br>• අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත (2016 අංක 14)<br>• හානිපූර්ණය සඳහා වන කාර්යාල පනත (2018 අංක 34)<br>• බන්ධනාගාර ආඥාපනත (1877 අංක 16)<br>• තරුණ වරදකරුවන් (පුහුණු පාසැල්) පනත (1939 අංක 28)<br>• ප්‍රජා පාදක විශෝධන පනත (1999 අංක 46)<br>• පුනරුත්ථාපන කාර්යාංශය පනත (2023 අංක 2)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| 29. ත්‍රස්තවාදී ක්‍රියාවන්හි යෙදී සිටි තැනැත්තන් නැවත සමාජගත කිරීම සඳහා වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම<br>30. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>31. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**17. සංචාරක හා ඉඩම් අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා සංචාරක හා ඉඩම් විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මතු කරමින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම<br>5. සංචාරක නියෝජිතායතන හා සංචාරක කර්මාන්තයේ යෙදෙන්නන් ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු<br>6. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, ප්‍රෞඪ ඓතිහාසික උරුමයන්, පරිසරය, දේශගුණික විවිධත්වය, සයුරු වෙරළ සම්පත් ආදිය මතු කරමින් ශ්‍රී ලංකාව සුවිශේෂිත සංචාරක දිවයිනක් ලෙස දේශීය හා විදේශීය සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම<br>7. සංචාරකයින් සඳහා නිවාඩු නිකේතනයන් හා සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථාන, හෝටල් පහසුකම්, ගුවන් හා මුහුදු ගමන් පහසුකම් ප්‍රවර්ධනය කිරීම<br>8. සංචාරක ව්‍යාපාරයේ යෙදෙන්නන් සහ ඒ ආශ්‍රිත ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම | 01. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය<br>02. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>03. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය<br>04. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය<br>05. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව<br>06. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව<br>07. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව<br>08. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව<br>09. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව<br>10. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව<br>11. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය<br>12. ඉඩම් මැනුම් සභාව<br>13. ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය | • සංචාරක පනත (2005 අංක 38)<br>• උද්භිද උද්‍යාන ආඥාපනත (1928 අංක 31)<br>• ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත (1972 අංක 1)<br>• ඉඩම් අත්කර ගැනීමේ පනත (1950 අංක 9)<br>• ඉඩම් සංවර්ධන ආඥාපනත (1935 අංක 19)<br>• ඉඩම් ආපසු පවරා ගැනීමේ ආඥාපනත (1942 අංක 61)<br>• රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත (1979 අංක 43)<br>• රජයේ ඉඩම් ආඥාපනත (1947 අංක 8)<br>• රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත (1979 අංක 7)<br>• මැනුම් පනත (2002 අංක 17)<br>• හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (1998 අංක 21 )<br>• ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත (1931 අංක 20)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| 9. සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම<br>10. රජයේ ඉඩම් පරිපාලනය හා කළමනාකරණය<br>11. ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම<br>12. ඉඩම් පරිහරණය පිළිබඳ උපදෙස් ලබාදීම<br>13. ඉඩම් නිරවුල් කිරීම හා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු<br>14. රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම<br>15. රජයේ කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම<br>16. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පරිපාලනය හා නීත්‍යානුකූලව බෙදාදීම<br>17. ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් ලබාදීම<br>18. රජයේ හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති ඉඩම් සම්බන්ධව දත්ත පද්ධතියක් සකස් කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම<br>19. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>20. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**18.** ඉවත් කරන ලදී.

**19.** කර්මාන්ත අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කර්මාන්ත විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන | 1. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය<br>2. ලංකා ලේලන්ඩ් ලිමිටඩ්<br>3. ලංකා අශෝක් ලේලන්ඩ් ලිමිටඩ්<br>4. සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව<br>5. සීමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම (KESCO)<br>6. සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම<br>7. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්<br>8. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)<br>9. ජාතික ව්‍යවසාය සංවර්ධන | • කර්මාන්ත සංවර්ධන පනත (1969 අංක 36)<br>• කර්මාන්ත ප්‍රවර්ධන පනත (1990 අංක 46)<br>• ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත (2006 අංක 17)<br>• ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත (1980 අංක 41)<br>• ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35)<br>• ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4)<br>• ශ්‍රී ලංකා පේෂකර්මාන්ත හා |

| | | |
|---|---|---|
| ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. පවත්නා කර්මාන්ත ශක්තිමත් කිරීමටත්, ආයෝජන අවස්ථා පුළුල් කරමින් නව කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශයන් ඇති කිරීමටත් අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම<br>5. බිඳවැටී ඇති ව්‍යාපාර හා කර්මාන්ත යළි නඟා සිටුවීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>6. දේශීය ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීම<br>7. සියළුම කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු අදාළ ආයතන සමග ඒකාබද්ධව නිරාකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>8. ආනයන අපනයන ක්‍රියාවලිය කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා "තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක්" ස්ථාපනය කිරීම<br>9. අපනයනය ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සියළු පළාත් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>10. කර්මාන්ත පුර වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම<br>11. භූගතව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් අධිතාක්ෂණය භාවිත කර ගවේෂණය කර නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීම<br>12. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීම<br>13. වේවැල්, පිත්තල, මැටි, ලී බඩු ඇතුළු ග්‍රාමීය කර්මාන්ත අගය වැඩිකිරීමේ කර්මාන්ත ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් අවශ්‍ය දිරිගැන්වීම් ලබාදිම<br>14. වඩු, වේවැල්, සහ පන් කර්මාන්ත වල පවතින අමුද්‍රව්‍ය ගැටළුවට වගා සමූපකාර ක්‍රමයක් යටතේ රජයේ ඉඩම් දිගු කාලීන බදු පදනම මත ලබාදී එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරි ගැන්වීම් ලබා දීම<br>15. දැව සහ ලී බඩු නිෂ්පාදකයන් මුහුණ දී සිටින අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළු වලට විසඳුම් ලබාදීම<br>16. වාත්තු සහ ලෝකුරු කර්මාන්ත වැනි සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිතව ඇති අමුද්‍රව්‍ය සහ වෙළෙඳපොළ ප්‍රශ්න නිරාකරණය කිරීම | අධිකාරිය<br>10. ලංකා ඛනිජ වැලි සමාගම<br>11. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම<br>12. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය<br>13. දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය<br>14. ජාතික ශිල්ප සභාව<br>15. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව<br>16. ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතනය<br>17. ලංකා ටෙක්ස්ටයිල් මිල්ස් එම්පෝරියම් ලිමිටඩ්<br>18. ලංකා සළුසල ලිමිටඩ්<br>19. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)<br>20. ජාතික මෝස්තර මධ්‍යස්ථානය<br>21. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය<br>22. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය<br>23. කාර්මික තාක්ෂණ ආයතනය<br>24. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>25. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම<br>26. විදාතා මධ්‍යස්ථාන | ඇඟලුම් ආයතන පනත (2009 අංක 12)<br>• රෙදිපිළි පංගු මණ්ඩල පනත (1996 අංක 33)<br>• ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත (1993 අංක 50)<br>• විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)<br>• ව්‍යාපාර නාම පනත (1987 අංක 7)<br>• සමාගම් පනත (2007 අංක 7)<br>• වෙළඳ සළකුණු පනත (1964 අංක 30)<br>• සීට්ටු ආඥාපනත (1935 අංක 61)<br>• පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| 17. ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳපල තුළ ඇඟළුම් නිෂ්පාදන හා සැපයුම පුළුල් කිරීම සහ දේශීය ඇගළුම් සඳහා සංචාරක වෙළඳපළ සංවර්ධනය කිරීම<br>18. බතික් කර්මාන්තය සඳහා අවශ්‍ය ඩයි වර්ග ඇතුළු ඉහළ ගුණත්වයෙන් යුතු අනිකුත් අමුද්‍රව්‍ය අවශ්‍යතා සැපයීම සඳහා වැඩපිළිවලක් සැකසීම<br>19. දේශීය හා විදේශීය වශයෙන් බතික් හා අත්යන්ත්‍ර කර්මාන්තය ප්‍රචලිත කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම<br>20. දේශීය රෙදිපිළි හා ඇඟළුම් අලෙවි පුරවර ඇති කිරීම සඳහා කටයුතු කිරීම<br>21. රෙදිපිළි නිෂ්පාදන වෙළඳපල විවෘත හා තරඟකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම<br>22. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළඳාම ප්‍රවර්ධනය හා නියාමනය<br>23. පුද්ගලික අංශය සමග තරඟකාරී මට්ටමින් මැණික් ආශ්‍රිත කර්මාන්ත නිර්මාණශීලී ප්‍රවේශයක් හරහා නව්‍යකරණයට ලක් කිරීම<br>24. අගය එකතු කරමින් තොරව මැණික් අපනයනය කිරීම සීමා කර ඒ වෙනුවට අගය එකතු කල මැණික් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කිරීම<br>25. මැණික් ආශ්‍රිත කර්මාන්තවල යෙදෙනන්න් හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා ඒ පිළිබඳව නවීන තාක්ෂණය මුසුවූ දැනුම ලබාදීමට පුහුණු අවස්ථා සැලසීම<br>26. මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් ලබාගත යුතු අවසර පත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සරල කිරීමට කටයුතු කිරීම<br>27. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>28. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**20.** **නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන හා නිවාස විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා | 1. නාගරික සංවර්ධන අධිකාරිය<br>2. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය<br>3. සෙලෙන්දිව ඉන්වෙස්ට්මන්ට් | • නාගරික සංවර්ධන අධිකාරිය පනත (1978 අංක 41)<br>• නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත (1980 අංක 2) |

| | | |
|---|---|---|
| ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. මහනගර, උපනගර හා තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය<br>5. නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු<br>6. පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය<br>7. මධ්‍යම පාන්තිකයින් ගේ නිවාස ගැටළු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ණය පහසුකම් සැලසීම<br>8. කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රම හඳුන්වා දීම<br>9. නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායි මිල යටතේ ඉඩම් ලබා දීමමගින් නව නිවාස ව්‍යාපෘති සඳහා අයෝජකයන් දිරිමත් කිරීම<br>10. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය<br>11. වගකීම් රහිත කසල බැහැර කිරීම් වැලැක්වීමට පියවර ගැනීම<br>12. සියළුම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූල ව සිදුකිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම<br>13. සියළු නාගරික ඉදිකිරීම්වල දී රථ වාහන නැවැත්වීමේ අංගන හා ආබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇතිකිරීම සහතික කිරීම<br>14. ජාතික භෞතික සැළසුම් හා ප්‍රාදේශීය භෞතික සැළසුම් පිළියෙල කිරීම<br>15. ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කර ගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදුකිරීම<br>16. සහාධිපත්‍ය දේපල කළමනාකරණය සහ නියාමන කටයුතු<br>17. මහජන සහාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් | ලිමිටඩ්<br>4. හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම (PQ 143)<br>5. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව<br>6. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)<br>7. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්<br>8. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>9. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව<br>10. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>11. රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව<br>12. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය<br>13. **ඉවත් කරන ලදී.**<br>14. ඕෂන් විව් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>15. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය<br>16. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | • නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනත (2008 අංක 36)<br>• නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත (1946 අංක 13)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන පනත (2018 අංක 23)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (1999 අංක 4)<br>• පොදු පහසුකම් මණ්ඩල පනත (1973 අංක 10)<br>• ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනත (1968 අංක 15)<br>• ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත (1979 අංක 17)<br>• ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත (2014 අංක 33)<br>• සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත (2008 අංක 35)<br>• වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57)<br>• පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම පනත (2022 අංක 3)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| ලෙස නිවාසවල අයිතිය පැවරීම<br>18. පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු<br>19. නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම<br>20. රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම<br>21. අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම්ද ඇතුලුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූලාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>22. පරිසර හිතකාමී ලෙස පිරිවැය ඵලදායී නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මඟපෙන්වීම<br>23. රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම<br>24. අදාළ නීති රීති හා ප්‍රමිතීන්වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය<br>25. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම<br>26. බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව<br>27. **ඉවත් කරන ලදී.**<br>28. ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීම<br>29. දේශීය ඉදිකිරීම්කරුවන් ශක්තිමත් කිරීම<br>30. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන් ශක්තිමත් කිරීම හා ආරක්ෂාව සැලසීම<br>31. සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු<br>32. සමුද්‍ර සහ සමුද්‍ර ආශ්‍රිත දූෂණ නිවාරණය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම<br>33. වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය<br>34. අපද්‍රව්‍ය බැහැරකිරීම හේතුවෙන් මුහුදු තීරයට සහ මුහුදු පතුලට සිදුවී ඇති හානිය වලක්වා ගැනීම සඳහා සමුදුරු පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>35. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>36. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**21.** විදේශ කටයුතු අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා | 1. විදේශගත රාජ්‍ය දූත මණ්ඩල<br>2. ජාතික සමුද්‍ර කටයුතු කාරක | • කොන්සල් කර්තව්‍ය පිළිබඳ පනත (1981 අංක 4) |

| | | |
|---|---|---|
| විදේශ කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. විදේශයන්හි ශ්‍රී ලංකාවේ කීර්තිමත් ප්‍රතිරූපය ස්ථාපිත කරමින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ ක්‍රියාකාරී රටක් ලෙස සහයෝගීතාව පුළුල් කරමින් විදේශ රටවල් සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාම<br>5. ජාත්‍යන්තර සහයෝගීතාවය පුළුල් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව අවශ්‍ය කටයුතු ඉටු කිරීම, සම්බන්ධීකරණය හා රජයට අවශ්‍ය උපදෙස් ලබා දීම<br>6. ශ්‍රී ලංකාවේ කීර්තිමත් ප්‍රතිරූපයට එල්ලවන අහිතකර ප්‍රචාරයන් සම්බන්ධයෙන් නිසි ප්‍රතිචාර දැක්වීම හා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ස්ථාවර කර ගැනීම<br>7. අන්තර් ජාතික හා කලාපීය දේශපාලන, ආර්ථික, පාරිසරික, සමාජ හා සංස්කෘතික සහයෝගිතා සංවිධාන සමග සක්‍රීයව කටයුතු කිරීම<br>8. විදේශ රටවල් සමග රාජ්‍ය දූත සබඳතා පවත්වාගෙනයාම හා ප්‍රඥප්ති, ගිවිසුම් සහ සම්මුතීන් පිළිබඳ සාකච්ඡා කිරීම<br>9. රාජ්‍ය දූත විශේෂ මුක්ති හා වරප්‍රසාද ලබාදීම<br>10. විදේශීය වෙළඳ, ආයෝජන හා සංචාරක, රැකියා හා විදේශ මුල්‍ය සබඳතා කටයුතු ප්‍රවර්ධනය සඳහා අදාළ අමාත්‍යාංශ හා ආයතන වලට අවශ්‍ය සහාය ලබා දීම<br>11. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා සමුද්‍රික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය වන විදේශ සබඳතා තහවුරු කිරීම<br>12. විදේශ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයින්ගේ සුබසාධනය පිළිබඳ අවශ්‍ය පියවර ගැනීම<br>13. කොන්සියුලර් සේවාවන් සැපයීම<br>14. ශ්‍රී ලංකා විදේශ සේවාව සහ විදේශීය දූත මණ්ඩලවලට අනුයුක්ත කරනු ලබන නිලධාරීන්ගේ පරිපාලනය සහ | සහා ලේකම් කාර්යාලය<br>3. ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය | • රාජ්‍ය දූත වරප්‍රසාද පනත (1996 අංක 9)<br>• උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත (2000 අංක 45)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| වෘත්තිමය කුසලතා නැංවීමට අවශ්‍ය පියවර ගැනීම<br>15. භූ දේශපාලන ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ශ්‍රී ලංකාවට හිතකර අයුරින්, එම ප්‍රවණතා කළමනාකරණය සඳහා අවශ්‍ය උපායමාර්ග පිළිබඳ රජයට උපදෙස් දීම<br>16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>17. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**22.** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. බුදුදහම ඇතුළු අනෙකුත් ආගම් ඇදහීමේ අයිතිය සුරක්ෂිත කිරීම<br>5. සියළු ආගම් වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සහ ආගමික අන්තවාදයට එරෙහිව පියවර ගැනීම<br>6. දහම් පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම<br>7. පූජා භූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීම<br>8. බෞද්ධ ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම<br>9. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම<br>10. ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම | 1. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව<br>2. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව<br>3. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව<br>4. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව<br>5. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව<br>6. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව<br>7. ඉවත් කරන ලදී<br>8. මහා භාරකාර දෙපාර්තමේන්තුව<br>9. මධ්‍යම සංස්කෘතික අරමුදල<br>10. බුද්ධ ශාසන අරමුදල<br>11. බෞද්ධ පුනරුද අරමුදල<br>12. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව<br>13. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>14. ටවර්හෝල් රඟහල පදනම<br>15. ජාතික කලා මණ්ඩලය<br>16. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය<br>17. ගාලු උරුමය පදනම<br>18. ජාතික ප්‍රසංගික කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ)<br>19. අපේ ගම<br>20. අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය | • බුද්ධ ශාසන අරමුදල පනත (1990 අංක 35)<br>• විහාර දේවාලගම් ආඥාපනත (1931 අංක 19)<br>• හින්දු සංස්කෘතික අරමුදල පනත (1985 අංක 31)<br>• මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත (1956 අංක 51)<br>• ජාතික ලේඛනාරක්ෂක පනත (1973 අංක 48)<br>• මධ්‍යම සංස්කෘතික අරමුදල පනත (1980 අංක 57)<br>• මහා භාරකාර ආඥාපනත (1922 අංක 01)<br>• සංස්කෘතික දේපළ පනත (1988 අංක 73)<br>• ලංකා කලා මණ්ඩල පනත (1952 අංක 18)<br>• පුරාවස්තු ආඥා පනත (1940 අංක 9)<br>• ටවර් හෝල් රඟහල පදනම පනත (1978 අංක 1)<br>• සීගිරි උරුමය පදනම පනත (1998 අංක 62)<br>• ගාලු උරුමය පදනම පනත (1994 අංක 7)<br>• අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත (2018 අංක 27)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| 11. මුස්ලිම් ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම<br>12. දුශ්කර ප්‍රදේශ වල පිහිටි ආගමික ස්ථාන වැඩිදියුණු කිරීම<br>13. සියලු ආගම් වලට අයත් ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක් නිර්මාණය කිරීම<br>14. රාජ්‍ය ලේඛණ විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම<br>15. මධ්‍යම සංස්කෘතික අරමුදල පරිපාලනය සහ ඒ පිළිබඳව අධ්‍යයනයක් කර ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කිරීම<br>16. ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>17. විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම<br>18. සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා වන අයුරින් සංස්කෘතික හා ජාතික උරුමයන් වල අභිමානය ප්‍රමුඛ වන සංචාරක වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම<br>19. ජාතීන් අතර සහයෝගය ඇතිකිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදාගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>20. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>21. නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>22. නාට්‍ය, සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම<br>23. ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව කෘතෘ භාග ගෙවීම පිලිබඳ ක්‍රමවේදයක් හඳුන්වාදීම<br>24. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>25. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**23.විදුලිබල හා බලශක්ති අමාත්‍ය**

| **I** වැනි තීරුව | **II** වැනි තීරුව | **III** වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත | 1. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පාලිත සමාගම් | • ලංකා විදුලිබල මණ්ඩල පනත (1969 අංක 17) |

| | | |
|---|---|---|
| පිහිටා විදුලිබල හා බලශක්ති විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනා දී මූලාශ්‍රයන් මගින් පුනර්ජීවන බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය<br>5. ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම<br>6. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම<br>7. දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම<br>8. විදුලි සම්ප්‍රේෂණය හා බෙදාහැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම<br>9. ජනනය කරනු ලබන විදුලිබලය උපරිම කාර්යක්ෂමතාවය සහිතව භාවිතා කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම<br>10. විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩුකිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම<br>11. හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම<br>12. ග්‍රාමීය විද්‍යුතනය<br>13. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම<br>14. ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු<br>15. ඛනිජ තෙල් හා ස්වාභාවික ගෑස් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු<br>16. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් හා අතුරු නිෂ්පාදන කටයුතු, තොග පවත්වා ගැනීම හා නිෂ්පාදනය හා බෙදාහැරීම<br>17. ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් | 2. ලංකා විදුලිබල සමාගම<br>3. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම<br>4. සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම<br>5. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව<br>6. සීමාසහිත ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්තය<br>7. ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය<br>8. සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම<br>9. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය<br>10. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය<br>11. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | • ශ්‍රී ලංකා විදුලිබල පනත (2009 අංක 20)<br>• ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත (1961 අංක 28)<br>• ඛනිජතෙල් සම්පත් පනත (2021 අංක 21)<br>• ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35)<br>• ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (2014 අංක 40)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| සංවර්ධනය කිරීම<br>18. බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම<br>19. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය<br>20. නිවාස, කාර්යාල හා කර්මාන්තශාලා සඳහා අඩු වියදමින් විදුලි බලය ලබා ගැනීම සහතික කිරීමට සූර්ය බල පද්ධති සහ සූර්ය කෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම<br>21. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයන් දිරිමත් කිරීම<br>22. කාර්මික අපද්‍රව්‍ය උපයෝගී කරගනිමින් බලශක්තිඋත්පාදනය ඉහල දැමීම<br>23. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>24. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**24. පරිසර අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා පරිසර විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. පරිසර සංරක්ෂණය හා කළමනාකරණ පිළිබඳ ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදනය කිරීම<br>5. වර්තමාන හා අනාගත පරපුර උදෙසා පරිසරය සුරැකීම වෙනුවෙන් ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම<br>6. පරිසර දූෂණය වැළැක්වීම පිණිස | 1. මධ්‍යම පරිසර අධිකාරිය<br>2. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>3. සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම<br>4. ශ්‍රී ලංකා ක්ලයිමේට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් | • පතල් හා ඛනිජ පනත (1992 අංක 33)<br>• ජාතික පාරිසරික පනත (1980 අංක 47)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම<br>7. පරිසර වෙනස්කම් සහ කාබන් භාවිතය අවම ආර්ථිකයක් සහිත තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීම සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම<br>8. තිරසර පරිසර සංකල්පයෙහි ඇති වැදගත්කම පිළිබඳව ජනතාව තුල ආකල්පමය වර්ධනයක් ඇති කිරීම<br>9. පරිසර ශක්‍යතාවයන් පිළිබද බලපත්‍ර නිකුත් කිරීම හා එම ක්‍රියාවලිය සමාලෝචනය කිරීම<br>10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>11. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**25. ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ක්‍රීඩා හා යෞවන කටයුතු විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>5. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සානුබලයන් සැපයීම<br>6. ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම<br>7. ශ්‍රී ලංකාවේ ප්රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැඟීම සඳහා ක්‍රීඩාව යොදාගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>8. ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර්ජාතික | 1. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>2. ජාතික ක්‍රීඩා සභාව<br>3. ජාතික ක්‍රීඩා විද්‍යායතනය<br>4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය<br>5. ක්‍රීඩා වෛද්‍ය ආයතනය<br>6. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනය<br>7. ජාතික තරුණ සේවා සභාව<br>8. ජාතික යොවුන් සේනාංකය<br>9. සී/ස. ජාතික තරුණ සේවා සමූපකාරය<br>10. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය | • ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත (2019 අංක 24)<br>• ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා පනත (1973 අංක 25)<br>• සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරී පනත (1999 අංක 17)<br>• ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)<br>• ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)<br>• යොවුන් සේනාංක පනත (2002 අංක 21)<br>• ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනත (1939 අංක 48)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| තරඟාවලට සහභාගී වීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම<br>9. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදුකිරීම<br>10. ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේදි තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම<br>11. ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම<br>12. ක්‍රීඩා සමිති සංවිධාන සහ ක්‍රීඩා තරඟාවලි ප්‍රවර්ධනය කිරීම<br>13. තරුණ පරපුරේ අභිලාෂයන් ඉටුවන ජාතික වැඩපිළිවෙලක් අරමුණු කරගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම<br>14. තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>15. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>16. තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු<br>17. තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලීත්වය සමාජ පිළිගැනීමක් ඇතිවන හා ඔවුන්ට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකිවන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම<br>18. දේශීය, විදේශීය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම<br>19. තරුණ ව්‍යවසායකයින් බිහිකිරීමට පියවර ගැනීම සහ ඔවුනට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම<br>20. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>21. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**26.** වාරිමාර්ග අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වාරිමාර්ග විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති | 1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>2. උමා ඔය, මොරගහකන්ද, කළුගඟ, ගිං, නිල්වලා, මල්වතු ඔය ඇතුළු අනෙකුත් ප්‍රධාන වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති<br>3. ඉංජිනේරුමය කාර්යයන් | • වාරිමාර්ග ආඥා පනත (1946 අංක 22)<br>• ගංවතුර ආරක්ෂණ ආඥා පනත (1924 අංක 24)<br>• රාජ්‍ය කාර්මික සංස්ථා පනත (1957 අංක 49 ) |

| | | |
|---|---|---|
| සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය සංවර්ධනය කිරීම<br>5. වාරිමාර්ග හා ජලාපවහන පද්ධති ඉදිකිරීම, ක්‍රමවත් නඩත්තුව මගින් අවශ්‍ය ජල සැපයුම ක්‍රමානුකූලව ලබාදීම.<br>6. ජල ගැලීම් පාලන යෝජනා ක්‍රම තුළින් ජලාපවහන හා ගංවතුර පාලනය සිදුකිරීමට කටයුතු කිරීම<br>7. කෘෂිකාර්මික සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙමින් ප්‍රතිපත්තිමය ලෙසින්, විදුලිය හා පානීය ජලය සැපයීමට අවශ්‍ය ජලාශ හා වාරි පහසුකම් මනා ලෙස කළමනාකරණයක් පවත්වාගෙන යාම<br>8. ජල පෝෂක ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි නිශ්චිත වශයෙන් නිර්ණය කර ඒවා තිරසාර අයුරින් සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම<br>9. ගංගා, ඇල, දොළ, වැව් ආදී ජලමූලාශ්‍ර ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීම<br>10. ජල දූෂණය පාලනය කිරීම සහ ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම<br>11. වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>12. වෙළි ආරක්ෂණ විධිවිධාන සම්පාදනය කිරීම<br>13. කරදිය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම<br>14. භූගත ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම හා වැසි ජල සංරක්ෂණය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම<br>15. මහවැලි කලාප වල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඉඩම් සම්බන්ධ කටයුතු<br>16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>17. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>4. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>5. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව | • ශ්‍රී ලංකාවේ මහවැලි අධිකාරිය පනත (1979 අංක 23)<br>• ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත (2017අංක 4)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**27. කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|

| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|---|
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කම්කරු හා විදේශ රැකියා විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කම්කරු සබඳතා ප්‍රමිතීන්, සේවක පරිපාලනය, සුභසාධනය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම<br>5. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමග අන්තර් සහයෝගිතාව පවත්වා ගැනීම<br>6. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය හා නියාමනය කිරීමේ කටයුතු<br>7. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම<br>8. කම්කරු සබඳතාවලට අදාළ නීතිරීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු<br>9. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම<br>10. ජාතික ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස ප්‍රතිපත්ති වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>11. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම<br>12. විදේශ රැකියා අවස්ථා බහුල කිරීම, ප්‍රවර්ධනය කිරීම හා එම රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතාවන් වැඩි දියුණු කිරීමට අදාළ ආයතන සමග කටයුතු කිරීම<br>13. විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා නියාමන ක්‍රියාවලීන් හඳුන්වා දීම<br>14. විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල | 1. කම්කරු දෙපාර්තමේන්තුව<br>2. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය<br>3. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය<br>4. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය<br>5. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය<br>6. ශ්‍රම වාසනා අරමුදල<br>7. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>8. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය<br>9. ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්ගලික) සමාගම | • සේවක මණ්ඩල පනත (1979 අංක 32)<br>• සේවක අර්ථසාධක අරමුදල පනත (1958 අංක 15)<br>• ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත (1956 අංක 47)<br>• කර්මාන්ත ශාලා ආඥාපනත (1942 අංක 45)<br>• කාර්මික ආරවුල් පනත (1950 අංක 43)<br>• ප්‍රසූතිකාධාර ආඥාපනත (1939 අංක 32)<br>• ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත (2009 අංක 38)<br>• පාරිතෝෂික ගෙවීම් පනත (1983 අංක 12)<br>• සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත (1954 අංක 19)<br>• කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීම (විශේෂ විධිවිධාන) පනත (1971 අංක 45)<br>• වෘත්තීය සමිති ආඥාපනත (1935 අංක 14)<br>• පඩිපාලක සභා ආඥාපනත (1941 අංක 27)<br>• කම්කරු වන්දි ආඥාපනත (1934 අංක 19)<br>• ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12)<br>• ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත (1985 අංක 21)<br>• ගාස්තු අයකිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත (1956 අංක 37)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට විදේශ විනිමය ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීමට හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම<br>15. විදේශ රැකියා නිම කර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>16. මැදපෙරදිග හා වෙනත් රටවල සේවය කරන ගෘහ සේවිකාවන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සහතික කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම<br>17. සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තියමය ගැටළුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය පවත්වා ගැනීම<br>18. විදේශ රටවල දී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම<br>19. විදේශ රැකියා නියෝජිතායන නියාමනය<br>20. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම<br>21. විදේශ රැකියා සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම හා විදේශ රැකියා නියෝජිතායතන විසින් රැකියා ස්ථාන සඳහා යොමු කිරීමේදී විදේශ රැකියාවල නියුක්තවන අයගේ සුභසාධනය තහවුරු වන ලෙස කටයුතු කිරීම<br>22. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>23. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**28.** මහජන ආරක්ෂක අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා මහජන ආරක්ෂාව පිළිබඳ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් | 1. ශ්‍රී ලංකා පොලීසිය<br>2. ජාතික පොලිස් අභ්‍යාස ආයතනය<br>3. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ලේකම් කාර්යාලය<br>4. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව<br>5. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>6. අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | • පොලිස් ආඥා පනත (1865 අංක 16)<br>• ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත (2011 අංක 44)<br>• ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත (1980 අංක 31)<br>• පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)<br>• ආගාමික හා විගාමික පනත (1948 අංක 20)<br>• පුරවැසි පනත (1948 අංක 18) |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. නීතිය හා සාමය පවත්වාගෙන යාම<br>5. සමාජ විනය තහවුරු කෙරෙන පුළුල් ප්‍රතිසංස්කරණ ඇතුළත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම<br>6. සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබෙන විවිධ අන්දමේ අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට හා මැඩපැවැත්වීමට කටයුතු කිරීම<br>7. රථවාහන ගමනාගමනය පාලනය කිරීම<br>8. මහජන ආරක්ෂාව තහවුරු කිරීමත්, මහජනතාවට සමීප වන පරිදිත් පොලිස් සේවයේ සේවා මට්ටම ඉහල නැංවීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදුකිරීම<br>9. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය නොවන සංවිධාන වල කාර්යයන් සම්බන්ධීකරණය කරමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වීමට අවස්ථා සැලසීම<br>10. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කටයුතු<br>11. ආගමන හා විගමන කටයුතු<br>12. අන්තරාකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය<br>13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>14. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | • ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)<br>• අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)<br>• අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)<br>• මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)<br>• ඖෂධවලට අබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)<br>• ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)<br>• මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත (2024 අංක 9)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**29. වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය**

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට | 1. වාණිජ දෙපාර්තමේන්තුව<br>2. සීමාසහිත ලංකා සතොස<br>3. සමූපකාර තොග වෙළඳ සංස්ථාව<br>4. මහපොළ භාරකාර අරමුදල<br>5. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br>6. මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව<br>7. ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය<br>8. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය<br>9. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමූපකාර සමිති ලියාපදිංචි කිරීමේ | • සමූපකාර තොග වෙළඳ සංස්ථා පනත (1949 අංක 44)<br>• වෙළඳුන්ට බලපත්‍ර දීමේ පනත (1961 අංක 62)<br>• මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66)<br>• අනුකූලතා ඇගයීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත (2005 අංක 32)<br>• මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත (1995 අංක 35)<br>• බුද්ධිමය දේපල පනත (2003 අංක 36) |

| | | |
|---|---|---|
| නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරිම<br>4. දේශීය වෙළඳපොල තුළ පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමෙන් හා හිඟයකින් තොරව සාධාරණ මිල ගණන්වලට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම<br>5. ප්‍රමාණවත්ව හා අඛණ්ඩව සාධාරණ මිලකට ආහාර හා සෙසු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සැපයුම සහතික කිරීම<br>6. වෙළඳපළ අසමතුලිතතාවයන්ගෙන් භාණ්ඩ හිඟයන් ඇතිවීම වැළැක්වීම<br>7. ආනයන හා දේශීය නිෂ්පාදන මගින් වෙළඳපලේ ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ සැපයීම පුළුල් කිරීම<br>8. ජාත්‍යන්තර වෙළඳ සබඳතා පවත්වාගෙන යාම<br>9. වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය සංවිධානයක කිරීම<br>10. බුද්ධිමය දේපල පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමයදේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු<br>11. පේටන්ට් බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම<br>12. පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිළ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවෙහි යෙදවීම<br>13. වෙළඳපොල තරඟකාරීත්වය තහවුරු කරමින් වෙළඳපොල තුළ අවිධිමත් ලෙස භාණ්ඩ ඌණතාව අවම කරමින් හා ස්වයං නියාමනය දිරිමත් වන පරිදි ක්‍රියා මාර්ග ගැනීම<br>14. ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ අවම තරඟකාරී මිළ ගණන්වලට අඛණ්ඩව සැපයෙන හා සැපයුම්කරුවන් ගේ සමපේක්ෂණ හැසිරීම් වළක්වා ගනිමින් පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම<br>15. සක්‍රීය සමුපකාර වෙළඳසැල් ජාලය පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය විවිධ භාණ්ඩ හා සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම<br>16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>17. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | රෙජිස්ට්‍රාර්)<br>10. සමුපකාර සේවක කොමිෂන් සභාව<br>11. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය<br>12. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | • පාරිභෝගික කටයුතු අධිකාරි පනත (2003 අංක 9)<br>• සමුපකාර සේවක කොමිෂන් සභා පනත (1972 අංක 12)<br>• සමුපකාර සමිති පනත (1972 අංක 5)<br>• ජාතික සමුපකාර සංවර්ධන ආයතන (සංස්ථාගත කිරීමේ) පනත (2001 අංක 1)<br>• ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත (2018 අංක 2)<br>• ආරක්ෂණ පියවර පනත (2018 අංක 3)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |